# 11 වන ශ්‍රේණිය - 1 වන පාඩම

## ජුදා සමාජ දැක්ම

### ◈ ආබ්‍රහම් කැඳවීම සහ ඇදහිල්ල

- ක්‍රි.පූ. 19 වන සියවසේදී කානාන් දේශයට ජන කණ්ඩායම් සංක්‍රමණය වුණි. එහි සුවිශේෂ පැමිණීමක් ලෙස ආබ්‍රහම් හා ඔහුගේ පවුලෙහි සංක්‍රමණයවීම ගත හැකිය.
- ආබ්‍රහම්ගේ මෙම පැමිණීම සුවිශේෂිත වන්නේ, එය දේව අණට කීකරුව හා ඇදහීමෙන් පැමිණි ගමනක් හෙයිනි.
- ආබ්‍රහම් තුළ පැවති ඇදහිල්ල ඉතා සුවිශේෂී වන අතර, ආබ්‍රහම් විසින් දේව කැඳවීමට දැක්වූ කීකරු ප්‍රතිචාරවලින් එය මනාව පිළිබිඹුව.
- මින් කරුණු 02 ක් සනාථය. එනම්,
  1. ඉශ්‍රායෙල් සමාජය යනු දෙවියන්වහන්සේගේ ඇදහිල්ල මත පමණක් ගොඩනැගුණු සමාජයකි.
  2. ඉශ්‍රායෙල් සමාජයෙහි ආරම්භය හා ආබ්‍රහම්ගේ කැඳවීම බද්ධව පවතින බව.

### ◈ ආබ්‍රහම් ලැබූ ගිවිසුම හා එහි පොරොන්දුව

- ආබ්‍රහම් හා දෙවිඳුන් අතර ඉතා ගැඹුරු සම්බන්ධතාවයක් තිබූ අතර, එහි එක් පියවරක් ලෙස දෙවිඳුන් විසින් ආබ්‍රහම් සමඟ ගිවිසුමකට එළඹුණි. එහි පොරොන්දු තුනකින් සමන්විතය.

**1. ආබ්‍රහම් විශාල ජාතියකට පියා වීම**

ආබ්‍රහම් වයස 99 දීත් දරුවන් නොසිටීම පිළිබඳ දෙවිඳුන් හට පැවසීම

ආබ්‍රහම් වූ මොහුට ජාතියේ පියා ලෙස ආබ්‍රහම් යන නාමය ලැබීය.

පොළොවේ දූවිලි තරම් වූ, අහසේ තාරකා ගණනට සමාන වූ දරු පරපුරක අයිතිය ඔහුට අයිතිවන බව දෙවිඳුන් පොරොන්දුවීම.

**2. දේශයක උරුමය ලැබීම**

ආබ්‍රහම් තම පියාගේ උරුමය හා හාරාන් දේශය අතහැර දේව හඬට කීකරු වීම

එම නිසා කානාන් වැනි සශ්‍රීක දේශයක උරුමය ලැබීම

### 3. අන්‍යයන්ට ආශිර්වාදයක් වීම

දේව පොරොන්දුවේ හැටියට ආබ්‍රහම්ගේ නාමය ආසිරි පැතීමේ නාමයක්ය.

ආබ්‍රහම්ගේ ඇදහිල්ලේ ආශිර්වාදය මුළු ලෝක වාසීන්ට හිමි වූ ඉතා විශාල ආශිර්වාදයකි.

එම නාමය හෙයින් දේව ආසිරි මුළු ලොවටම ලැබෙනු ඇත.

## ◈ දස පනත

පනත් 10 කින් මෙය සමන්විත වීම

ඉශ්‍රායෙල් ජන සමාජය හා එහි සමාජ දර්ශනය මේ මතින් ගොඩනැගී තිබීම

ජීවිතය හා සමාජය සඳහා මූලික සාරධර්ම ගැබ් වී තිබීම

- දස පනත පහත අයුරින් කොටස් 02 කට බෙදිය හැක.

1. මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටි යුතුය.
2. කැපූ රූපයක් හෝ සාමානාත්වයක් සාදා නොගෙනුව, ඊට නමස්කාර නොකරව සේවය නොකරව.
3. දෙවිඳුන්ගේ නාමය අගරු ලෙස භාවිතා නොකරන්න.
4. සබත් දවස ශුද්ධව ගත කිරීමට සිතට ගන්න.
5. මවටද පියාටද ගෞරව කරන්න.

   (මෙම ආඥාව පොරොන්දුවක් ඇති එක ආඥාවයි. මෙහි පොරොන්දුව තම ජීවිත ආයුෂ පව් කරන බවයි.)

} මිනිසා හා දෙවිඳුන් අතර සම්බන්ධය හා මිනිසා දෙවිඳුන් සම්බන්ධයෙන් කළ යුතු යුතුකම් හා

6. මීනි නොමරව
7. කාම මිත්‍යාචාරය නොකරව
8. සොරකම් නොකරව
9. අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව.
10. අසල්වැසියා සතු කිසිදු දෙයකට ඇලුම් නොකරව.

} මිනිසා හා මිනිසා අතර සම්බන්ධය හා මිනිසා සතු පැවතිය යුතු ගුණධර්ම සබඳතාවේ පනත්වල අඩංගුය.

# 11 වන ශ්‍රේණිය - 2 වන පාඩම

## මෙසියස් වහන්සේ හා පරිපූර්ණ ජීවිතයක්

◈ **මෙසියස්** ⟶ | හෙබ්‍රෙව් බසින් මෂියාත් | ග්‍රීක බසින් ක්‍රිස්ට්‍රෝස් |

(මෙයාසා) (ආලේප කරනු ලැබූ තැනැත්තා)

### ◈ මෙසියානු සංකල්පයේ විකාශය

- ඉශ්‍රායෙල් ඉතිහාසයෙහි ආලේප ලැබූ තැනැත්තාත් නොවැදෑරුම් වෙයි.

  1. පූජකයන්(ආරොන් හා ඔහුගේ පුත්‍රයන් ආලේප තෛලයින් ආලේප කිරීම. නික්මයාම 29:7)
  2. දිවැසිවරුන්
  3. රජවරුන්

### ◈ රජකම හා බැඳුණු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්‍ෂණ

1. දාවිත් රජ පරපුරෙන් පැමිණෙන මෙසියස් පිළිබඳ ඉඟිය
   - යෙසායා දිවැසිවර විසින් මෙසියස් දාවිත් පරම්පරාවෙන් පැමිණෙන දිවැස් වැකි පවසා ඇත.
   - මේ අනුව මෙසියානු ආගමනය දාවිත් රජ පරම්පරාවෙන් සම්පූර්ණ විය.
2. මෙසියස් වහන්සේගේ රාජ්‍යය සාදාකාලින බව
   - නොයෙක් වධයන් වේදනාවන් මැද මෙසියස් වහන්සේ දෙවිඳුන්ගේ සාම රාජ්‍ය පිහිටවයි.
3. සාධාරණත්වය හා යුක්තිය පැවැත්ම
   - සාධාරණත්වය හා යුක්තිය මෙසියස් රාජ්‍යයේ මූලික අංගවේ.
   - උන්වහන්සේගේ අරමුණ සදාකාලික සාම රාජ්‍යයක් බිහි කිරීමයි.
4. බරක් වූ විය දණ්ඩ කඩා යුක්තිය උදාකිරීම.
5. අසිරිමත් උපදේශකයාණෝ
6. සාම කුමාරයාණෝ

### ◈ මෙසියස් තුමාගේ ආලෝකය පරිපූර්ණ ජීවිතයක් කරා ළඟ කරයි.

- සාමය සංහිඳියාව ලැබීම.
- පාපයෙන් නිදහස ලගාවීම.
- රෝගවලින් නිදහස ලැබීය.
- දේව රාජ්‍ය තුළ ඇති වටිනාකම් ඉගැන්වීම.
- දේශපාලන හා ආර්ථික පීඩනයෙන් නිදහස ලැබිම.

### ◈ විශේෂ කරුණු

- ශුභාරංචියේ ඇති ලෙස යේසුතුමන්ගේ ගෝලයන් උන්වහන්සේ මෙසියස් හෙවත් ක්‍රිස්තුස් ලෙස දැක සිටීම.
- උන්වහන්සේගේ ජීවිත පූජාව නිසා ලෝවාසි සැමට පාපයෙන් මිදිමත්, ඒ තුළින් පරිපූර්ණ ජීවිතයක් ලබාගැනීමට පුළුවන් විය.
- මෙසියස් වහන්සේගේ ජීවිත පූජාව නිසා මිනිසා සියලු අන්දමේ වහල් බවින් නිදහස හා පීඩනවලින් නිදහස ලබයි.
- ඇදහිලිවන්ත ජීවිතයක පරමාර්ථ ලෙස <u>දේව ගරුබිය, යුක්තිය හා ධර්මිෂ්ඨකමට කැපවීම, සාමය</u> පිහිටුවයි.

# 11 වන ශ්‍රේණිය - 3 වන පාඩම

## යහපත් බැටළු එඬේරා

- එඬේර වෘත්තිය යනු ඉශ්‍රායෙලය තුළ තිබූ සුලබ වෘත්තියකි.
- ආබෙල්, ජොකොබ්, දාවිත් යනු එඬේර ජීවිත ගෙවූ පුද්ගලයන්ය.
- දෙවියන්වහන්සේ යනු ඉශ්‍රායෙල්වරුන්ගේ එඬේරාණෝය.
- එමෙන්ම නව ගිවිසුම තුළ යේසු තුමන් යහපත් බැටළු එඬේරාණන් ලෙස දැක්වේ.
- දෙවිඳුන් විසින් අපට ප්‍රේමයත්, පෝෂණයත්, ආරක්ෂාවත් එඬේරෙක් විලසින් ලබාදෙයි.

### ◈ එඬේර චරිත ගුණාංග

**අ) පෝෂණය**

- බැටළුවන්ට අවශ්‍ය ආහාර හා ජලය සැපයීම් එඬේරාගේ මූලික කාර්යයකි.
  උදා: එඬේරාණෝ බැටළුවන් ''සුනිල් තණබිම් මත සතප්වා'', (ගීතාවලිය 23:2) ඔවුන් ''හොඳ තෘණවලින්'' (එසකියෙල් 34:14) පෝෂණය කරන්නාහ.

**ආ) මඟ පෙන්වීම හා රැකබලා ගැනීම**

- ''මම නැතිවූ බැටළුවන් සොයන්නෙමි. මුලාව ගිය බැටළුවා ආපසු නොගෙන්නෙමි, තුවාල වූ බැටළුවාගේ තුවාල බඳින්නෙමි. ලෙඩ වූ බැටළුවන් රැකබලා ගත්තෙමි.''(එසකියෙල් 34:16)

**ඇ) ආරක්ෂා කිරීම හා ජීවිතය කැප කිරීම**

- මෙම කාර්යයද එඬේරෙක් තුළ ඇති වැදගත් කාර්යය භාරයකි.
- දිව්‍ය එඬේරාණන් වන දෙවියන් වහන්සේ තම බැටළු රැල වන තම සෙනඟ සිට ඔවුන් රක්ෂා කරයි.
- මෙහි වැදගත් කාරණය වන්නේ බැටළුවන් වෙනුවෙන් එඬේරා තම ජීවිතය පරදුවට තබා කටයුතු කර තම ජීවිතය පවා පූජා කරයි.
  උදා: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් පාපිෂ්ඨ සෙනඟගේ ගැළවීමට කුරුසියෙන් දිවි පූජා කිරීම.

**ඈ) හඳුනා ගැනීම**

- බැටළුවන් සඳහා දක්වන සංවේදී බවත්, ඔවුන් ගැන ඇති ගැඹුරු අවබෝධය එඬේරෙකු තුළ ඇති තවත් සුවිශේෂ ගුණාංගයකි.

### ◈ එඬේරුන් ලෙස අප ක්‍රියා කළ යුතු අයුරු

- **එඬේර ප්‍රේමය**
  - බැටළුවන් හට පෝෂණයත්, ආරක්ෂාවත්, සොයා යන්නෙත් එඬේරා පැටළුවන් හට ඇති ප්‍රේමය හේතුවෙනි.

- අපත් නායකයන් ලෙස ක්‍රියා කරන විට අපේ භාරයට දී සිටින අය ගැන ක්‍රියා කළ යුතුවන්නේ ප්‍රේමය පෙරදැරිවය.

- **කැපවීම හා වැයවීම**
  - කැපවීම හා වැයවීම යනු ප්‍රේමයේ මූලිකාංගය වේ.
  - ජේසුතුමන් සිය දිවිය යාගයක් ලෙස පූජා කරන තරමට කැපවූ සේක.
  - අපද ආත්මාර්ථයෙන් මිදී සමාජයේ අන් අය වෙනුවෙන් කැපවීමෙන් වැයවීමෙන් සේවය කළ යුතුය.

- **සේවකත්වය**
  - අපගේ යහපත් බැටළු එඬේරාණෝ දෙවියන් වහන්සේය.
  - එම නිසා අදහිල්ලෙන්, දෙවිඳුන් සමඟ බැඳෙමින් සමාජයට සේවය කිරීම වැදගත්ය.

## ◈ බැටළුවන් ලෙස අප ක්‍රියා කළ යුතු අයුරු

- **එඬේරාගේ හඬට ප්‍රතිචාර දැක්වීම**
  - යහපත් බැටළු එඬේරාවක් යේසුස්ගේ හඬ තුලින් යනවිට වංක එඬේරුන් පසුපස යෑම වැලකෙයි.

- **එඬේරාගේ හඬට පිටුපෑමෙන් සිදුවන අන්තරාය**

  ''දොරටුව නම් මමය, මා තුළින් යමෙක් ඇතුළුවන්නේද, ඔහු ගලවනු ලැබ ඇතුලට හා පිටතට ගොස් ආහාර ලබන්නේය.'' (යොහාන් 10:45)

  - දේව කැමැත්තට අවනත නොවූ විට - අප ජීවිතය විකාශය හා අන්තරාදායක තත්ත්ව හරහා ගමන් කරයි.

- **විශ්වාසවන්ත බැටළු එඬේරාණන්ට කීකරු වීම**

## ◈ වැදගත් කරුණු

- බැටළු එඬේරාණන්ට කීකරු වීම, විශ්වාසවන්තවීම බැටළුවන් වන අපහට පූර්ණ ජීවනය අත්කර දෙයි.

- එමෙන්ම අයහපත් එඬේරුන්ගේ අරමුණ විනාශකාරිය. එම නිසා එඬේරෙකු නොවන කුලීකරු භයානක අවස්ථාවලදී බැටළු රැළ දමා පලාගොස් විනාශ වීම බලා සිටින්නේය.

# 11 වන ශ්‍රේණිය - 4 වන පාඩම
# දුක් උසුලන සේවකයාණෝ

ඇදහිල්ල නිසා බොහෝ දුක් විඳ ඇත. ඉන් දෙදෙනෙක් වන්නේ ජෝබ් හා ජෙරමියාය. ඔවුන්ට ඔවුන්ගේ සියල්ල අහිමි වුවත්, කොතරම් වද වින්දත්, කෙතරම් අපහාසයන් ආවද දෙවියන් වහන්සේ සමඟ කීකරුව අධි විශ්වාසයෙන් සිටිය.

## ◈ දුක් විඳින සේවකයාණෝ

- ජුදෙව් ජනතාව බලාපොරොත්තු වූයේ, මෙසියස් යනු ඉතා රාජශ්‍රීයෙන් යුත් බලයෙන් යුත් රාජකීයෙක් ලෙසයි.
- නමුත් යෙසායා දිවැසිවරයා යටහත්පහත්, ඉවසීම හා දුක් දැරීම යන චරිත ලක්‍ෂණ වලින් යුත් කෙනෙකු පිළිබඳ දිවැස්වැකි පවසා ඇත.
  - එතුමාණෝ දෙවියන්වහන්සේගේ ආත්මානුභාවය ලබා සිටී. (යෙසයා 42:1)
  - සැර පරුෂ ගති ලක්‍ෂණ වෙනුවට මෘදු ලීලාවෙන් සැරසී සිටියි. (යෙසායා 42:2)
  - දුක් පීඩාවලට ලක්වූවන් තවත් පීඩාවලට ලක් නොකරයි. (යෙසායා 42:3)
  - අධෛර්‍ය නොවන මෙහෙකරු කල කිරීමට ලක්නොවී, යුක්ති සහගතව ක්‍රියාකරයි. (යෙසායා 42:4)
  - දුක හා වේදනාව දරයි. (යෙසාය 53:3)
  - අප වෙනුවෙන් ලද පහරවලින් අපට සුවය ලැබී තිබේ. (යෙසායා 53:5)
  - මරණය, අපගේ පව් කමා කරන පූජා වීමේ මරණයකි. (යෙසායා 53:10)
  - පව්කරුවන්ගේ පව් දරා ගනිමින් මැදහත්කාරකම් කරයි. (යෙසායා 53:12)

## ◈ දුක්විඳින සේවකයාණන් වන ක්‍රිස්තුස්වහන්සේ

- දුක්විඳින සේවකයාණන්ගේ කාර්යභාරය සම්පූර්ණ කරන්නේ යේසුස් බව නව ගිවිසුමෙහි සඳහන්ය.
- එම දුක්විඳීමේ ප්‍රතිඵලය වූයේ උන්වහන්සේ විජයග්‍රාහි උත්ථානයයි.

## ◈ දුක්විඳින සේවකයාණන් හා අපි

- අප දෙවියන්වහන්සේ සමඟ ඇදහිල්ලෙන් බැඳී ක්‍රියා කළ යුතුය. එවිට අපට උන්වහන්සේ දුක් විඳීමේ පූර්ණ ආනිසංස අපට ලැබේ.
- මමත්වය දැන ගනිමින් පරාර්ථකාමී සේවයකට ඇතුළුවීම අවශ්‍යය.
- ලෝකයෙන් පැමිණෙන විවිධ පීඩාවන්, අපවාද දුක් විඳීම, කරදර සියල්ලය ධෛර්‍යයෙන් හා ඇදහීමෙන් මුහුණ දිය යුතුය.
- දුක්විඳීම හා පූජාවීම අපගේ සේවයේ අනිවාර්‍ය අංගයකි.

## 11 වන ශ්‍රේණිය - 5 වන පාඩම
## ප්‍රේමයෙන් දිවි ගෙවමු

- ලොව ආරම්භයේදීම දෙවියන්වහන්සේගේ ප්‍රේමය මිනිසා කෙරෙහි පැවතුනි.
- මිනිසාගේ පාපය හේතුකොටගෙන දේව ප්‍රේමයෙන් ඈත්වීම.
- එයට හේතු වූ කරුණක් ලෙස අනුවණකම, පළිගැනීම, ඊර්ෂ්‍යාව, තණ්හාව, වෛරය, නොඉවසිලිවන්තකම, ආත්මාර්ථකාමී බව, උඩගුකම, ක්‍රෝධය වේ.
- **ප්‍රේම පිළිබඳ පාවුල්තුමා විසින් කොරෙන්තිවරුන්ට ලියූ පළමුවෙනි පත්‍රයෙහි ප්‍රේමයෙහි ගුණාංග පහත අයුරින් දැක්වේ.**
  - ඉවසිලිවන්තය
  - කරුණාවන්තය
  - ඊර්ෂ්‍යා වන්නේ නැත
  - පාරට්ටු කරගන්නේ නැත
  - උඩගු වන්නේ නැත
  - විනීතය
  - පරාර්ථකාමීය
  - හනික නොකිපේ
  - නපුර සිතේ ධාරණය කර නොගනියි
  - අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවේ
  - හරි දේ ගැන ප්‍රිති වේ
  - සියල්ල උසුලයි
  - විශ්වාසයට ඉමක් නැත
  - බලාපොරොත්තුවට නිමක් නැත
  - ඉවසීමට අගක් නැත

  } සදහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාව ප්‍රේමයයි.

- **ශු. මාක් 12:29-33 අනුව ප්‍රේමය සම්බන්ධව ශ්‍රේෂ්ඨතම ආඥාවන් 02 ක් ඇත.**

1. තමාගේ මුළු ජීවිතයෙන්ම දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම
   (පුද්ගලයෙකු මුළු පුද්ගල භාවයෙන්ම දෙවියන්වහන්සේට ප්‍රේම කළ යුතුයි)
2. තමාට මෙන්ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම
   (යේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව අසල්වැසියා යනු තමා වටා සිටින අවශ්‍යතාවයෙන් පෙලෙන ඕනෑම කෙනෙකු වේ. එම ප්‍රේමයට සීමාවක් නොමත.)

- පාවුල්තුමා එපීස වැසියන්ට පෙන්වා දෙන ලෙස ප්‍රේමයේ පදනම මත තම ජීවිතය ගොඩනැගී ඇති විට එය යාච්ඤාවෙන් වඩා සවිමත් වේ.
- එවැනි ජීවිතයකට ක්‍රිස්තුස්වහන්සේ සිත් තුළ වාසය කරන්ටත් ප්‍රේමයේ ස්ථිරව පිහිටා සිටින්නත් ඇදහිල්ල අවශ්‍ය වේ.
- ප්‍රේමය වඩාත්අර්ථ ගැන්වෙන්නේ වැය වීම තුළය.
- යේසුස් වහන්සේගේ ජීවිතය, සේවය, දුක්විඳීම, මරණය තුළද ගැබ්ව ඇත්තේ පරිත්‍යාගිවූ ක්‍රියාකාරී ප්‍රේමයයි. සැබෑ ප්‍රේමය එයයි.

# 11 වන ශ්‍රේණිය - 6 වන පාඩම
## සාමයට කැපවෙමු

- ❖ යේසුස් වහන්සේ කන්ද උඩ දේශනයේදී සාමය ඇති කිරීම සම්බන්ධව අවධාරණය කරයි. සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය.ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නෝය. යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය. ස්වර්ගය ඔවුන්ගේය.
  (ශු. මතෙව් 5:9-12)
- ❖ සාමය උදෙසා වෙහෙස වී ක්‍රියා කිරීම දෙවියන්වහන්සේට ප්‍රසන්න කටයුත්තක් බවයි.
- ❖ ඇතැම් අවස්ථාවල සාමය කඩවීමට පුද්ගලයෙකුගේ මුවින් නික්මෙන වචනය හේතුපාදක වේ.
- ❖ එසේ නම් සාමය බිඳී යන ක්‍රියාවලින් වැලකී සිටීම දේව අභිමතයි.
- ❖ යෙසායා දිවැසිවරයා විසින් යේසුස් වහන්සේ පැමිණීමට ප්‍රථම සාමය පිළිබඳ දිවැසිවරයා යෙසායා විසින් ප්‍රකාශ කර තිබුණි.
  සාමයට කෙලවරක් නොමැති බවත් එය ස්ථිරවම පිහිටුවන බවත් එහි යුක්තිය හා ධර්මිෂ්ඨකම රජකම් කරන බව සඳහන්ය
- ❖ ''ශාලෝම්'' යන හේබ්‍රිව් වචනය භාවිතා කරමින් සාමයට පැතීමද යුදෙව්වන් හා මුල් කිතුනුවෝ පුරුව සිටියහ.
- ❖ ''අයිරේනියා'' නැමැති ග්‍රීක වචනයෙන් ද අදහස් කරන්නේ සම්පූර්ණ සාමයයි.
- ❖ ලෝකය පුරා සාමය ඇති කිරීමට මුල් වූ පුද්ගල චරිත බොහෝ ඇත. ආර්ථික. සමාජයීය, දේශපාලනමය හා ආගමික වශයෙන් ඇප කැප වෙමින් සාමය ස්ථාපිත කිරීමටඔවුන් වෙහෙස වී ඇති බව පැහැදිලිය.

### ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා

- ❖ 1972 දී නිල පූජකවරය ලබා මුලින්ම මඩකලපුවේ සහ ත්‍රිකුණාමලයේ ප්‍රධාන දෙව් මැදුරුවල සේවය කරන ලදි.

- ❖ සෑම ජන කොටසක් සමගම එකට වාසය කළ එතුමා සාමය ඇති කිරීමට විශාල වෙහෙසක් ගත් පියතුමෙකු ලෙසට ප්‍රසිද්ධය.

- ❖ ''කිසිවෙක් තමාට ස්වාමියාණෝ කියා නොගන්න. නායකයා සේවකයා විය යුතුය.'' යන්න එතුමාගේ සේවයෙහි පදනම විය.

### ගරු තිස්ස බාලසූරිය පියතුමා

- ❖ 1945 දී මෙතුමා පැවිදි කතෝලික පූජකවරයා පතා නිමල මරිය නිකායේ පෙර පුහුණු ආයතනයකට බැඳුණි.

- ❖ වෛරය, මිත්‍යාව නැති කළ හැක්කේ සතුරන්ටද, ප්‍රේම කිරීමෙන් හා සමාව දීමෙන් පමණක් බව එතුමාගේ කෘතීන් තුළ සඳහන්ය.

- ❖ රට තුළ ඇති එක්සත්කම, නිදහස, සංවර්ධනය හා සමාජ සාධාරණත්වය තුළින් ජාති ආගම් හා සමාජ අතර සමගිය සාමය ඇති කරගත හැකි බව එතුමා තරයේ විශ්වාස කළේය.

**විශේෂ කරුණක්**

මුළු ලොවම පාපයෙන් ගලවා ගැනීම සඳහා පැමිණි මනුෂ්‍ය පුත්‍රයා වන ''සාමයේ කුමරා'' අප වෙනුවෙන් කුරුසියෙහි දිවි පුදා ලොවට සාමය ඇති කළේය.

# 11 වන ශ්‍රේණිය - 7 වන පාඩම
# කමාව අත් දකිමු

- කමාව දීම ගැන ඉගැන්වූ යේසුස් වහන්සේ එය ඉගැන්වීම පමණක් සීමා නොකර, කුරුස පූජාවේදී තමන්ට වරද කළ අයට සමාව දීම තුළින් එය ප්‍රත්‍යක්‍ෂය.

- එසේ නම් ස්වාමීන්ගේ යාච්ඤාවෙහි සඳහන් පරිදි අපට කමාව ලැබීමට නම්, අප සමාව දීම ඉගෙන ගත යුතුය.

- එලෙස තම කමාව දීමට උත්සුක වූ පූජකයෙක් ලෙස **දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ** ගත හැක.

    - මෙතුමා හට තුර්කි ජාතික අලි අන්කාර් යන වෙඩිකරුවා විසින් වෙඩි තබන ලද අතර, ඉලක්කය වැරදි පාප් වහන්සේට එම උණ්ඩය නොවැදුණු අතර, එම ක්‍රියාවට ප්‍රතිචාරයක් ලෙස දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ එම වෙඩිකරුවාගේ සිරමැදිරියට ගොස් ඔහුට කමාව දානය කළේය.

- එවැනිම තම වරදකරුට කමාව දුන් දේවගැතිවරයෙක් ලෙස ගරු පීටර් පේරාඩි ද සිල්වා දේවගැතිතුමා ගත හැකිය.

## විශේෂ කරුණු

- කමාව දීම තුළින් යේසුස් වහන්සේ සමාජයට ආදර්ශයක් දුණි.

- එමෙන්ම දෙවියන් වහන්සේගේ ඈත්වීමේ පාපය අවසන් කර, දෙවියන්වහන්සේ හා මිනිසා අතර, යළි නව සම්බන්ධතාවයක් ඇති කරනු ලැබුවේ යේසුස් වහන්සේගේ කමාව දීමේ සංකේතයක් ලෙස කුරුසියෙහි පූජාවීමෙනි.

- කමාව දීමත්, කමාව ලැබීමත් දේව රාජ්‍යයේ උතුම් ගුණාංගයක් ලෙස හැඳින්වේ.

## කමා නොවූ දාසයා

මෙහි පසුබිම නම් විශාල ණය මුදලක් නොගෙවූ දාසයෙක් හට තම ස්වාමියා කමාව දීම එම ණය බරින් නිදහස් කළ අතර, එම දාසයා තමාගේ දාසයාගේ ණය මුදල කමා නොකරබැවින් එය දැනගත් ස්වාමියා යලිත් ඔහුගේ දාසයාට දඬුවම් කළේය.

- **මෙම උපමාව මගින් ලැබෙන ආදර්ශය**
    - සමාව දීමට ක්‍රියා කළ යුතුය.
    - කමාව දීම දේව ගුණාංගයක් බව.
    - කමාව දීම ඉල්ලීමක් නිවටකමක් නොවිම.
    - කමාව අප කාටත් අවශ්‍ය බව.
    - කමාවදීමට හා කමාව ලැබිමට නැඹුරු වන අප දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකරන බව.
    - කමාව දීම හා ලැබීම තුළ ජීවිතය අලුත්වීමකට පත්වන බව.

# 11 වන ශ්‍රේණිය - 8 වන පාඩම
# ඒකත්වයෙන් දිවි ගෙවමු

❖ විවිධත්වය තුළ ගොඩනැගෙන දැඩි සම්බන්ධතා හා ඒ තුළ ඇති ශක්ති සම්පන්න භාවයත් කිතුණු දිවියේ පැවැත්මට අවශ්‍ය බව අප වටහා ගත යුතුය.

## මිදිවැලෙහි උපමාව

- මිදිවැල නම් යේසුස් වහන්සේය. උද්‍යාන පාලකයා දෙවියන් වහන්සේය.

- උද්‍යාන පාලකයා වන දෙවියන්වහන්සේ තම පුත් යේසුස් තුළින් අප දේව සබඳතාවයට ඇතුළු කළ සේක.

- යේසුස් හා ඒකාබද්ධවීමට යමෙකුට නොහැකි නම්, නියම කිතුනුවකු ලෙස ජීවත්වීමට නොහැකිය. කිතුනුවෙකු ලෙස ඵල දැරීමට අපය නොහැකි නම් වන දේ බයිබල් අනුසාරයෙන් සොයා බලමු.

  - ඵල නොදරන අතු කපා හරින සේක.(ඵල නොදරන අතු යනු, යේසුස් වහන්සේට බද්ධව සිටියත් දේව ගුණාංග ලෝකයාට නොදීමට කටයුතු කරන අයයි. එවැනි අතු දේව රාජ්‍යයට ප්‍රයෝජනයක් නොවන අතු බව පෙනේ.

- අපගේ ජීවිතවල ඇති ඵල දැරීමට ඇති බාධා ඉවත්කොට දෙවියන්වහන්සේටම ප්‍රයෝජනවත් ලෙස අප යොදා ගත යුතුය.

  - මිනිස් හදවත් තුළ පවතින වෛරය, ක්‍රෝධය, පළි ගැනීම වැනි අයහපත් සිතුවිලි ඒකත්වයෙන් දිවි ගෙවීමට බාධාවකි.

    උදා: රටක් රටකට, ජාතියක් ජාතියකට විරුද්ධව ලෝකය පුරා පවතින යුධ ගැටුම් එය සනාථ කිරීමට කදිම නිදසුනකි.

  - ඉහත සඳහන්වන ඒකත්වය යන වචනය තුළින් දෙවියන්වහන්සේට හා යේසුස් වහන්සේ අතර සම්බන්ධය පෙන්වා දේ. එසේම සභාවක් ලෙස කිතුනු අප යේසුස් වහන්සේ සමඟ ඒකත්වයෙන් සිටිය යුතුය.

  - කිතුණු සභාව නිකාය හැටියට බෙදී සිටීමත්, විවිධ කාරණා මුල් කරගෙන වෙන්ව උත්සාහ දැරීමත් හේතු කොටගෙන කිතුනු ඒකත්වයෙහි ආදර්ශය පළුඳු වී ඇත.

  - යොහාන් 17:22 හි සඳහන් ලෙස අප ඒකත්වයෙන් සිටින විට දෙවියන්වහන්සේගෙන් ක්‍රිස්තුස් වහන්සේ ලද තේජශ්‍රීය සම්පූර්ණ වේ.

  - මෙයින් පැහැදිලි වන්නේ අප නිකාය වශයෙන් නොබෙදී එකමුතුව කටයුතු කළ යුතුය.

  - එලෙස එකමුතුව කටයුතු කරන සංවිධාන ලෙස,
    - ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL)

- ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය (TCL)
- ශ්‍රී ලංකා බයිබල් සමාගම (CBS)
- තරුණ කිතුනු සංගමය (TMCA)
- තරුණ කාන්තා කිතුනු සංගමය (YWCA)
- කිතුනු කම්කරු සහෝදරත්වය (CWF)

- ඒකත්වයෙන් සිටීම පිළිබඳ දේව වචනයෙහි මෙලෙස සඳහන්ය.

  ''ඔබ සියල්ලන් ක්‍රිස්තුස් වහන්සේ තුළ එක් කෙනෙකු මෙන් සිටිනා නිසා ජුදෙව් ග්‍රීක භේදයවත් ස්ත්‍රී, පුරුෂ භේදයවත් නැත. ඔබ ක්‍රිස්තුස්ට අයිති නම් ඔබ ආබ්‍රහම්ගේ වංශයට අයිතිව පොරොන්දු ලෙස උරුමක්කාරයෝද වන්නාහුය.''

  (ගලාති 3:28-29)

- විවිධ නිකාය යනු උන්වහන්සේ මා සම්බන්ධව ඇති විවිධ අවයවයි. නිකාය විවිධ වූවද ක්‍රිස්තුස්ගේ ප්‍රේමය කරණ කොටගෙන එකම අරමුණකින් තුළ සහා එකමුතුවක් ගොඩනැගිය හැක. මෙය වත්මන් කිතුනුවන් හැටියට තේරුම් ගෙන ක්‍රියා කරමු.

# 11 වන ශ්‍රේණිය - 9 වන පාඩම
# බලාපොරොත්තුව හා සදාතන ජීවනය

- කිතුනුවන් වන අපට මෙලොව ලෞකික බලාපොරොත්තුවලට එහා ගිය අනර්ඝ බලාපොරොත්තුවක් ඇත. එය නම් සදාතන ජීවනයයි.

- දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් බලාපොරොත්තුව හේතුවෙන් ඔහුට විශාල කැපකිරීමක් කිරීමට සිදුවුනු නමුත් දෙවියන් වහන්සේ විසින් ඔවුන්ගේ බලාපොරොත්තු වූ කනාන් දේශය ලබා දුනි.

- ඒ වගේම දෙවියන් වහන්සේ විසින් මොසෙස් හට හා යුදෙව් සෙනඟ හට ලබාදුන් බලාපොරොත්තුව හේතුවෙන් කටුක වූ කාන්තාරය හි ගමන් කළ අතර ඉන්පසු ඔවුන්ට පොරොන්දු දේශය හිමි විය.

- මෙයින් තේරුම් ගත හැක්කේ දෙවියන්වහන්සේ දුන් බලාපොරොත්තුවේ ගමන කටුක නමුත් එහි අවසානය ඉතාමත් ප්‍රිතිමත් එකක් බවයි.

- කිතුනු බලාපොරොත්තුව වන්නේ ආත්මාර්ථයෙන් තොරවූ බලාපොරොත්තුවකි. එය දෙවියන්වහන්සේගේ කැමැත්ත වන අතර එම බලාපොරොත්තු නම යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.

- එම උසස් බලාපොරොත්තුව ඉෂ්ට කරගැනීමට දෙවියන්වහන්සේ අපහට ශුද්ධාත්මයාණන් වහන්සේගේ දේව ප්‍රේමය ප්‍රදානය කරන සේක.


- මෙයින් තේරුම් යන්නේ දෙවියන්වහන්සේ අපට ලබාදෙන උසස්ම තිළිණය නම් සදාකාල ජීවනයයි.

- එය ඉෂ්ට කරගැනීමට අප තුළ ඇති විය යුතු ජීවිත පරිවර්තනය සඳහා අවශ්‍ය කරුණු තුනක් පහත දැක්වේ. එනම්,

  1. ධර්මිෂ්ඨකම
  2. ශුද්ධකම
  3. උතුම් ප්‍රීතිය

## ධර්මිෂ්ඨකම

- ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකම කරණ කොටගෙන ධර්මිෂ්ඨකම උරුම වේ.
- එය අත්කර ගත හැකි සැලැස්මක් ඇත. එනම්,



## ශුද්ධකම

- ශුද්ධකම යනු දෙවියන්වහන්සේ කෙරෙහි පූර්ණ ඇදහිල්ලයි.
- ශුද්ධකමෙහි ජීවිතයක ලක්ෂණ මෙසේය.
    - ක්‍රිස්තුස් වහන්සේ වර්ණයෙන් උත්ථාන කොට මහිමයට පත්කළ දෙවියන්වහන්සේ ඇදහීම
    - නිෂ්ඵල ජීවිත මාර්ග වලින් මිදීම.
    - ක්‍රිස්තුස් වහන්සේගේ දිවි පිදීම තුලින් තමකම නැසීම.
    - තෘෂ්ණාවලට වහල් නොවී කීකරු දරුවන් මෙන් හැසිරීම
    - හැසිරීමෙන් ශුද්ධව සිටීම.
    - දේව ගරු බියෙන් ජීවත් වීම.

## උතුම් ප්‍රිතිය....

- මිනිසා නොවැදගත් කාරණා සඳහා අතිශය ප්‍රිතිමත් වෙයි.
- එනමුදු අපට නැති නොවන ප්‍රීතියක් හිමිව ඇත. එය නම් සදාතන ජීවනයයි.
- සදාතන ජීවනය සමඟ මුහුවීමට නම් අප යේසුස් වහන්සේ සමඟ ඒකාබද්ධ විය යුතුය.
- කිතුනු අප ක්‍රිස්තුස් නොදුටු නමුත් අප උන්වහන්සේ ප්‍රේම කරන්නෙමු අදහා ගන්නෙමු. එම ඇදහිල්ල නිසාම අපගේ ආත්ම ගලවනු ලබයි. එවිට අප මහා ප්‍රීතිය වන සදාකාලික ජීවනය ලැබේ.

# 11 වන ශ්‍රේණිය - 10 වන පාඩම
# මුල් කිතුනු සභාවෙන් ආදර්ශයක්

- සභාව යනු පිරිසක් රැස්වන ස්ථානයක් ලෙස ව්‍යවහාර සිදු කරයි.
- කිතුනු සභාව යනු කිතුණුවන්ට ආවේණික වූවකි.
- කිතුනු සභාව තුළ විවිධ නිකාය පැවතියදී සැවොම එකට දෙවියන්වහන්සේ තුළ පෝසණය ලබයි.

## මුල් කිතුනු සභාව

- යේසුස් වහන්සේගේ උත්ථානයෙන් දින 50 කට පසු පෙන්තකොස්ත මංගල්‍ය පැවැති අතර, එය යුදෙව් කෘෂිකාර්මික මංගල්‍යයකි. එම නිසා යුදෙව්වන් සිය අශ්වයන්ගේ ප්‍රථම ඵලය පිදීමට යෙරුසලමට පැමිණෙයි.

- එදවසහි යේසුස් වහන්සේගේ ගෝලයන් සහ ඔවුන් ඇතුළු පිරිස යේරුසලමෙහි උඩුමහලෙහි යාච්ඤා කරමින් සිටියේය.

- එවිට එහි සිටි සියළුම දෙනාහට ශුද්ධාත්ම දානය පිරිනැමුණි.

- එම දින 3000 පමණ සෙනඟ බෞතීස්ම ගින්නෙන් ලබා සභාවට එකතු විය.

- එහි විශේෂ සිදුවීම් කිහිපයක් සිදුවුණි.

  1. සැඩ සුළඟක් හමන්නා සේ හඬක් අහසෙහි නික්මවීම. (ශුද්ධාත්ම බලය)
  2. ගිණි දළු වැනි දිව් බෙදී ගොස් එකිනෙකා මත පිහිටීම. (ශුද්ධාත්ම බලය දැනීම)
  3. සැවොම ශුද්ධාත්ම බලයෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කතා කිරීම. (ශුද්ධාත්ම බලය තුළ ජවලිතකම)

- මුල් කිතුනු සභාවේ කොටස් 02 කි.

  1. නමස්කාර ජීවිතයෙහි නියැලීම.
  2. ධර්මදූත සේවයෙහි යෙදීම.

## නමස්කාර ජීවිතයෙහි නියැලීම

- පෙන්තකොස්ත දින කිතුනුවා ශුද්ධාත්මයාණන් තුළ නව ජීවිතයක් ලැබූ අතර, එය ආත්මය වර්ධනය කරගන්නට පිළිවෙත් ඉටුකළේය. එනම්,
  1. වචනය ඉගැන්වීම
  2. සහභාගීකම
  3. රොටි කැඩීම
  4. යාච්ඤාව
  5. සියල්ල පොදුවේ තබා ගැනීම

- නමස්කාර ජීවිතය තුළ ආදර්ශමත් කිතුනුවා
  1. දේව නමස්කාරයට ක්‍රියාශීලිව සහභාගි වෙයි.
  2. ගෞරවාන්විතව ශු. සහභාගිකමට එක්වීම.
  3. යාච්ඤාව තුළ සවිමත් ජිවිත ගත කරයි.

4. දේව වචනය තුළ පිහිටා ඒ අනුව ජීවිත හැඩගස්වා ගැනීම.

## ධර්මදූත සේවයෙහි යෙදීම

- ශුද්ධාත්ම ආගමනය සිදුවූ පෙනත්කොස්ත දින ප්‍රථම දේශණය ඉටුකළ පේදුරුතුමා මුල් සභාවේ ධර්මදූත මෙහෙවර දියත් කළේය.

- සියල්ලෝම පසුතැවී සිත් හරවාගෙන පව් කමාව ලබන පිණිස යේසුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම ස්තාපනය ලැබිය යුතු බවත්, එවිට ඔවුන් ශුද්ධාත්ම දීමනාව ලබන බවත් ඔහු අවධාරණය කළේය.

- මෙසේ වර්ධනය වෙමින් සභාව ගමන් කළ මඟ දෙස බලන කල පහත අංශ දෙක තුළින් සිය සාක්ෂිය ප්‍රකාශ කර ඇත.

  1. ධර්මදාන මෙහෙවර
  2. සුභ සාධන මෙහෙවර

## ධර්මදාන මෙහෙවර

- දේශනා කිරීම තුළින් සුභාරංචි සේවා ව්‍යාප්ත කිරීම.
- යේසුස් වහන්සේගේ නාමයෙන් බෞතිස්ම ස්ණාපනය තුළින් පසුතැවිලි වීමෙන් ජීවිත ගත කිරීමට දිරිමත් කිරීම.
- බොහෝ අරුම පුදුම හා ලකුණු තුලින් යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇදහිල්ල වර්ධනය කිරීම.
- යේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ සාක්ෂි දැරීම.
- රෝගාතුර වූවන් හා දුෂ්ඨාත්ම වැසූවන් සුවකිරීම තුළින් සුව සහනය සැලසීම.

## සුබ සාධන මෙහෙවර

- මෙහි වටිනාකම් රැසකි.
- සියල්ල පොදුවේ තබා ගැනීම
- බෙදා ගැනීමේ ප්‍රතිපත්ති මුල් සභාවෙහි ක්‍රියාත්මක වීම.
- සාමානාත්මතාව උසස් කොට සැලකීම.
- තමන් සතු දෙයින් කිසිවක් තමාගේමයි නොපැවසීම.
- ඇදහිලිවන්ත සමූහයා එක්සත්ව, එක්සිත්ව සිටීම.
- ගැටලු ඇතිවීමේදී ඒ සඳහා විසඳුම් ක්ෂණිකව යෙදීම.

  උදා: ග්‍රීක් වැන්දඹුවන්ගේ සහනාධාර පිළිබඳ ප්‍රශ්නය

## වැදගත් කරුණක්

- සභාවේ නමස්කාරික ජීවිතය, ධර්මදූත සේවය තුළ ධර්ම දානය හා සුබ සාධනය සවිමත් කරගැනීම වැනි වූ මුල් කිතුනු සභාවේ වටිනාකම් වත්මන් කිතුනු සභාව විසින් ද යොදා ගැනීම අත්‍යාවශ්‍ය බව පැහැදිලිය.

# 11 වන ශ්‍රේණිය - 11 වන පාඩම
# ඵලදායි මෙහෙවරක්

- ◈ යේසුස් වහන්සේගේ ශ්‍රමක කණ්ඩායමේ සාමාජිකයෙකු වූ සීමොන් පේතෘස් විශේෂ චරිතයකි.
- ◈ යේසුස් වහන්සේ කිතුනු සභාව ඔහු මත ගොඩනගන බව පවසමින් ''පර්වතය'' අර්ථය වූ කේපස් නම් නාමයෙන් ඔහුව හඳුන්වා දෙන ලදි. (''බිය නොවන්න මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත.'' (ශු. ලූක් 5:10))
- ◈ යේසුස් වහන්සේ දෙවියන්වහන්සේගේ ක්‍රිස්තුවරයාණන් වන බව ප්‍රකාශ කළ ප්‍රථම ශ්‍රාවකයා වන්නේද සීමොන් පේදුරුය.
- ◈ යේසුස් වහන්සේ නාඳුනන බව තෙවරක්ම පේදුරු ප්‍රකාශ කළේය. එහෙත් ඔහු තුළ කොතරම් දුර්වලතා පැවතියද, යේසුස් වහන්සේ ඔහුට සේම ඔහු ද යේසුස් වහන්සේට බොහෝ සෙයින් ප්‍රේම කළේය.
- ◈ යේසුතුමන්ගේ ස්වර්ගාරෝහණයෙන් පසුව මුල් සභාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ පේදුරුතුමන්ය.

## දේශනා කිරීමේ මෙහෙවර

- ◈ ශුද්ධාත්ම බලයෙන් පේදුරුතුමා කළ දේශනය කිතුනු සභාව ඉගැන්වීමක් විය.
  - පළමුව එතුමා නිර්භීත ලෙස සියලු බාධක මැද තම දේශනය සඳහා පසුතලය සකසයි.
  - එයට පුරාණ ගිවිසුමෙහි අනාවැකි නිසි පරිදි දක්වමින් කරුණු හෙළි කරයි.
  - යේසුස් වහන්සේ පිළිබඳ සිය අත්දැකීම ඇසුරෙන් කථා කරයි.
  - අත්දැකීම් ඇසුරෙන් ලැබූ විශ්වාසයේ ස්ථාවරය ප්‍රකාශ කරයි.

- ◈ පේදුරුතුමාගේ ප්‍රබල දේශනාව තුළින්
  - දිවැසිවර ඉගැන්වීම් සත්‍ය පසක් කරදෙයි.
  - යේසුස් වහන්සේගේ මෙහෙයවරෙහි වටිනාකම පහදා දෙයි
  - දේව සැලැස්මේ උතුම් බව ප්‍රකාශ කිරීම
  - පසුතැවීම තුළින් විශ්වාසය තහවුරු කිරීම

## සුව කිරීමේ මෙහෙවර

- අපෝස්තළුවරු විසින් කළ ප්‍රථම සුව කිරීම ලෙස සුදර්ශන දොරටුව අසල සිටි උපන්දා පටන් කොරවූ මිනිසා සුව කිරීම ගත හැකිය.

- එහිදී යොහාන්තුමා හා පේදුරුතුමා දෙවියන්වහන්සේගේ ශුද්ධාත්ම නාමයෙන් මුවකිරීම සිදුකළේය.
- එමෙන්ම පේදුරුතුමා දුර්වල මිනිසා කෙරෙහි සංවේදී වෙමින් තම ශක්තියෙන් පමණක් උදව් කළ නොහැකි බව පෙන්වයි.
- ඒවගේම යේසුස් වහන්සේගේ සුවය සහ අධිකාරීත්වය මුදලට ගත නොහැකි බව ඔහු ආදර්ශනය කරයි.
- එමෙන්ම දෙවියන්වහන්සේගේ සුවය ශාරීරික, මානසික, අධ්‍යාත්මික යන සියලු අංගවලින් පරිපූර්ණ බව සනාථය.

## අභියෝග ඉදිරියේ නිර්භීත සේවය

### ◈ පේදුරුතුමා මුහුණ දුන් අභියෝග

- යුදෙව්වන්ගේ ප්‍රසාදය ලබාගැනීම සඳහා ක්‍රියා කළ හෙරොද් රජ පේදුරුව අල්ලා සිරකර දැඩි මුරකාවල් දැමීම.
- අභියෝග ඉදිරියේ පේදුරු ලැබූ ගැළවීම විස්ම ජනකය. සිරගෙයි ලා සිටියදී දේවදූතයෙක් විත් පේදුරු බේරාගත්තේය. සභාවේ යාච්ඤා පේදුරුතුමා වෙනුවෙන් එසවුනි.
- අපත් පසුබට නොවී ක්‍රිස්තුස් වෙනුවෙන් නිර්භීත ලෙස සේවය කරමු.

## මෙම සිදුවීම් වලින් පේදුරුතුමා උගත් දේ

- දේව හඬට ප්‍රතිචාර දැක්විය යුතු බව.
- මිනිස් නීතියට වඩා දෙවියන්වහන්සේගේ නීතියට ප්‍රමුඛස්ථානය දිය යුතු වේ.
- කිසිවෙකුගේ තරාතිරමේ නොබැලිය යුතු බව.
- දෙවියන්වහන්සේට කීකරු විය යුතු බව.
- සේවය අවශ්‍ය සැමටම ඕනෑම විටක සේවය කිරීමට ඉදිරිපත් විය යුතු බව.

## 11 වන ශ්‍රේණිය - 12 වන පාඩම
## ජීවිත වෙනසක්

- පාවුල්තුමා යනු කිතු සසුනෙහි ඉතා විශිෂ්ට ප්‍රේරිතයෙකි. ඔහුගේසේවය අතිවිශිෂ්ටය.
- අපෝස්තුළු දොලොස්දෙනා අතර නොසිටියද **පාවුල්තුමා විජාතීන්ගේ අපෝස්තුළු** ලෙස හඳුන්වයි.
- පාවුල්තුමා විසින් නව ගිවිසුමෙහි ග්‍රන්ථ 27 න් 13 ක්ම රචනා කර ඇති අතර, එය කිතු සසුනේ ඉදිරි ගමනට මහගු සේවයකි.
- පාවුල්තුමාට සාවුල් යන හේබ්‍රෙව් නමත්, පාවුලස් යන රෝම නාමයත්, පාවුල් යන ග්‍රීක් නාමයද භාවිතා කරයි.

### සිලිසියාවේ කාර්යයන්හි සාවුල්ගේ පසුබිම

- සාවුල් සිලිසියාවේ තාර්සස්හි උපත ලැබීය. මෙම නගරය ධනවත් වානිජ නගරයක් විය.
- විවිධ භාෂා හා විවිධ ජාතීන්, දර්ශනවාදීන්, අධ්‍යාපන විශාරදයන් බහුල නගරයක් ලෙස මෙය හඳුන්වයි.
- මෙම නිසා මේවා හි අභ්‍යාෂය හා විශාල දැනුමත් හා භාෂා පිළිබඳ සහජ හැකියාවක් පාවුල්තුමාට තිබූ බව මේවායින් පැහැදිලිය.

### ජුදෙව් පසුබිම

- පාවුල්තුමා භක්තිමත් යුදෙව්වෙකි. බෙන්ජමින් ගෝත්‍රය ඔහුගේ ගෝත්‍රයයි.
- හේබ්‍රෙව් බස හොඳින් දැන සිටියේය. සිනගෝන අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනය සඳහා සැන්හෙඩ්‍රික් සභාවේ සාමාජික වූ ගාමාලියෙල් යටතේ ලැබීය.
- කුඩා කල සිට තම වෘත්තිය ලෙස කූඩාරම් කර්මාන්තය ඉගෙනීය.

### පරිසියෙකු ලෙස ආගමික පසුබිම

- පරිසි යන්නෙහි අර්ථය වෙන්වූ යන්නයි.
- පාවුල්තුමා පරිසි පවුලක උපත ලැබීය.
- එම නිසා යුදෙව් වත් පිළිවෙත් සහ නීති රීති හැදෑරීමට යොමුවිය.
  උදා: කොන්ක්‍රෙයාවේදී හිස මුඩු කිරීම / තිමෝතියස් චර්මඡේදනය කිරීම
- පරිසිවරයෙකු ලෙස ආගමේ පදනම වූ පංච පුස්තකය එතුමා හැදෑරීය.

- සැන්හෙඩ්‍රින් සභාවෙහි සාමාජිකයෙකු ලෙස ක්‍රියා කරන ලදි.

## රෝම පුරවැසියෙකු වීමේ පසුබිම

- දැඩි යුදෙව් භක්තියෙකු වූ පරිසිවරු සාවුල් කිතුනුවන් මර්දනය කිරීමට පෙළඹුණු අතර විශාල පීඩාද එල්ල කළේය.
- පීඩාව මර්ධනය හා මරණය ඉදිරියේ ක්‍රිස්තු අනුගාමිකයෝ කිසිසේත් අත්හැරීමට සූදානම් නොවීය.
- මෙම පීඩා මධ්‍යයේ කිතුනුවට ක්‍රිස්තියානි නාමය ප්‍රථම වරට ලැබුණේද අන්තියෝකිය නම් වූ සභාවේදීය.
- එමෙන්ම ගල් ගසා ස්තේපන් මරා දැම්මේදී ගල් ගසන්නන්ගේ සළු රැකබලා ගන්නා ලද්දේද සාවුල් විසින්ය.
- කිතුනු සභාවෙහි ප්‍රථම වේද සාක්‍ෂසික වූ ස්තේපන්තුමා මරණයට නිර්භයව මුහුණ දුන් අතර එම ජීවිත ආදර්ශය සාවුල්ගේ ජීවිත පරිවර්තනය බලපෑ බව නිගමනයකට එළඹිය හැක.

## සාවුල්ගේ ජීවිත පරිවර්තනය

- දමස්කයෙහි සැඟවී සිටි කිතුනුවන් අල්ලා ගැනීමට පාවුල් විසින් දමස්කයට ගියේය.
- ඒ යන අතරමඟදී සාවුල් හට යේසුස් වහන්සේ කථා කරනු ලැබීය.
- ඉන්පසු සාවුල් අන්ධ විය.
- යේසුස් වහන්සේ ඔහුට කියූ ලෙස පාවුළු නුවරට ගියේය.
- එහිදී අනනියස් නම් පුද්ගලයා විසින් පාවුළු සුව කළ අතර, ඉන්පසු සාවුල් සේවය පිළිබඳ වටහා ගත්තේය.

## සිත් හැරීමෙන් පසු සාවුල්ගේ මෙහෙවර

- ධර්ම දූත මෙහෙවරෙහි යෙදීම්
- යේසුස් වහන්සේ ගැන ධර්ම ශාලාවේදී දේශනා කිරීම්
- අභියෝග මැද සුභාරංචිය ගෙන යාම.

# 11 වන ශ්‍රේණිය - 13 වන පාඩම
# හවුල් නායකත්වයෙන් ජය

## සිරියාවේ අන්තියෝකිය සභාව

◈ ප්‍රථම වරට කිතුනුවන් හට ''ක්‍රිස්තියානි'' නාමය ලැබුණේ මේ සභාව තුළිණි. දිව්‍යසිවරුන් හා ගුරුවරුන්ගෙන් සමන්විත වූ මෙම සභාව තුළ පාවුල්තුමා සහ බර්ණබස් තුමාද සේවය කළහ. මෙහි දී ''අගබස්'' නම් දිව්‍යසිවරයා කියූ අනාවැකියක් මා ශුද්ධාත්ම මඟ පෙන්වීම යටතේ පාවුල් තුමා සහ බර්ණබස් තුමා පළමු ධර්ම දූත ගමන ගමන් කළ සේක.

## හවුල් නායකත්වයෙන් පළමු ධර්ම දූත ගමන

- අන්තියෝකිය සභාවෙන් ඇරඹූ දූත මෙහෙවර සිරියාවේ සිලුකිය නම් නැම් තොටුපලින් ආරම්භය විය. ඉන්පසු ඔවුන් බර්ණබස්ගේ උපන් නගරය වන සයිප්‍රස් ගිය අතර, යුදෙව් රටක් වූ එහි මොවුන් දේශනා කරමින් සැරිසැරූහ. ඉන්පසු යොහාන් මාර්ක් නම් තරුණයන් දූත ගමන සඳහා සම්බන්ධ විය.

- ඉන්පසු පාපස් හි ගමන ඇරඹූ මොවුන් බාර්ජේසුස් නම් බොරු අනාගතවක්‍ත මායාවට හසු වූ සර්ගියස් පාවුලස් නම් තැනැත්තා ඔහුගෙන් බේරාගෙන සුභාරංචි දේශනා කොට යොසුස් වහන්සේගේ මාර්ගයෙහි යැවූහ.

- පාපස් වලින් ගමන නිම කළ ඔවුන් පම්පිලියේ පර්ගාවට ගිය පසු යොහාන් මාර්ක් නැවත හැරී ගියේය. යොහාන් මාර්ක් හැරී ගියද, පසුකාලීන ධර්ම දූත සේවය තුළ හොඳින් සේවය කළේය.

- පීසදිය අන්තියෝකිය තුළදී මොවුන් දෙදෙනා සබත් දිනයන්හි දේශනා කිරීමට පෙළඹුණි. එම හේතුවෙන් එහි ජනතාවට ගැළවීම ලැබූ අතර, ඊළඟ සබත් දිනවලද නුවර වැසී සියල්ල දේව වචනය ඇසීමට එක්විය.

- මෙලෙස ගමන් කළ දූත ගමනේදී විවිධ අභියෝග හා පීඩා ඔවුන්ට පැමිණි අතර, ශුද්ධාත්ම බලය කරණ කොට ගෙන ඒවාට ඔවුන් හොඳින් මුහුණ දුනි.

- ඉකෝනිය නම් නගරය තුළ මොවුන්ට පීඩා ආ නමුදු මොවුන් නොසැලී දේශනා කළ අතර, අරුම පුදුම ලකුණු හා හාස්කම් සිදු කිරීමට ඔවුන්ට හැකි විය.

- මේ සියල්ලෙන් පසු මොවුන් තර්ජන ගර්ජන මධ්‍යයේ උපන් දා කොරවූ මිනිසෙක් ලුස්ත්‍රාවේදී සුව කළ අතර, පාවුල්තුමා හා බර්ණබස් තුමා එහි සෙනඟ දෙවියන් යැයි සිතා වන්දනාමාන

කිරීමට සැරසුණි. ඉන්පසු ඔවුන් සත්‍ය වූ දෙවියන්වහන්සේ පිළිබඳ සෙනඟට කියාදී සුභාරංචිය දේශනා කළේය.

- දර්බය තුළදී බොහෝ දෙනෙකු සුබ දේශනාව මගින් ශ්‍රාවකයන් කිරීමට හැකි විය.
- ඉන්පසු ලුස්ත්‍රාවෙන් ඉකෝනියටත්, ඉකෝනියෙන් පිසීදියේ අන්තියෝකියටත්, එයින් පම්පිලියේ පර්ගාවට විත් අන්තාලියෙන් නැව් නැග සිරියාවේ අන්තියෝකිය සභාවෙන් ගමන අවසන් විය.

- හවුල් නායකත්වයෙහි ලක්‍ෂණ
- දේව රාජ්‍ය උදෙසා දුක් විඳිමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම
- ශ්‍රාවකයන් දිරිමත් කිරිම
- ඇදහිල්ලට ස්ථිරව පවතින්නට අනුශාසනා කිරීම
- සභාවේ සැදැහැවතුන් සහ මූලිකයන් පත් කිරීම
- උපවාස කර යාච්ඤාවේ යෙදෙමින් සමිඳුට සැදැහැවතුන් භාරදීම
- සුබ අස්න දේශනාව
- අභියෝග පීඩා මැද නොකඩවා සේවය

## යෙරුසලමේ මන්ත්‍රණ සභාව

- විජාතීන්ගේ චර්ම ඡේදනය පිළිබඳ මෙහි දී ප්‍රශ්නයක් පැන නැගුණු අතර, මෙහිදී මන්ත්‍රණ සභාවෙහි මුලසුන දැරූ යාකොබ්ගේ මතය වූයේ, චර්ම ඡේදනය විජාතීන්ට අවශ්‍ය නැති බවත්ය. මෙයින් පැහැදිලි වන ලෙස යුදෙව්වන් හා විජාතීන් අතර ඇති වූ ගැටුම් නිරාකරණය කිරීම පියවර ගත් බව පැහැදිලිය.

## ධර්ම දූත ගමනෙහි සාර්ථකත්වයෙන් ගත හැකි ආදර්ශ....

- අභියෝග මධ්‍යයේදී වුවද, දෙවියන්වහන්සේගේ මග පෙන්වීමට අපට ඇති බව.
- සැමවිටම සාමූහිකත්වය ඇතිවිට අභියෝගවලට හොඳින් මුහුණ දීමට හැකි බව.
- සෑම මොහොතකම තැනට සුදුසු නුවණ ප්‍රයෝජනයට ගනිමින් වැඩ කිරීම.
- පරාජය හමුවේ වුවද, ශුද්ධාත්මයාණන් තුළ පසුබට නොවී නිර්භීතව පීඩාවන්ට මුහුණදීම.

# 11 වන ශ්‍රේණිය - 14 වන පාඩම
# දිරියෙන් යුතු මෙහෙවර

◈ **පාවුල්තුමා හා බාර්ණබස් තුමා අතර යොහාන් මාර්ක්ව දෙවන ධර්ම දූත කමකට ගෙනයාමේදී මත ගැටුමක් ඇති වුණි. මෙම නිසා බාර්ණබස්තුමා හා යොහාන් මාර්ක් සයිප්‍රසයට ගිය අතර, පාවුල්තුමා සීලස්, තිමෝතියස්, ලූක් යන තිදෙනා සමග දෙවන ධර්මදූත ගමන ආරම්භ කළේය.**

- **සිරියාවේ අන්තියෝකිය.....**

  මත ගැටුමෙන් පසු සාවුල් සීලස්ද කැටුව ගමන ඇරඹීය.

- **සිරියාව හා සිලිසියාව**

  පළමු ධර්මදූත ගමනේ ඇරඹු ස්ථිර කර ගමන් කිරීම

- **දර්බය හා ලුස්ත්‍රාව**

  ධර්මඡේදනයෙන් පසු තිමෝතියස් සමග ගමනට සම්බන්ධ විය. ශුද්ධාත්මයාණන් විසින් ආසියාවේ වචනය දේශනා කිරීමේ ගෙනයාමෙන් පසුව මගිදෝනියට යන ලෙස මග පෙන්වීය. ඉන්පසු ඔවුන් ග්‍රෝතිකව ගමන් කළේය.

- **පිලිප්පිය**

  **ත්‍රෝවසය** — **සමොත්‍රාසිය** — **කෙයාපොලිසිය** — **පිලිප්පිය**

- **විදේශිය යුදෙව්වන් වාසය කළ එහි සගන් දිනයේදී ගං ඉවුරේ රැස්වූහ.**

## ◈ පැමිණි අභියෝග

- ගං ඉවුරේ රැස්වූ බැතිමතුන් ස්ත්‍රීන්ය. ධර්මදූත සේවය ඔවුන්ට දේශනා කිරීමෙන් පසු ආරම්භ විය.
- තියාතිරා ස්ත්‍රියක් වූ ලිදයා දම්පාට සායම් වෙළෙන්දියකි. ඇයද ඇගේ පවුලේ සියල්ලම බෞතීස්මය ලැබූහ. යුදෙව් ආගමික හා සංස්කෘතික පිළිවෙත් අභියෝගයට ලක් කරමින් ස්ත්‍රීන්ට මූලික වූ සභාවක් පාවුල්තුමා විසින් බිහි කළේය.

## ◈ වහල් තරුණිය

- ගුප්ත ආත්මයන් ආවේශ වී පේන කියා ලාභයක් ස්වාමිවරුවන්ට ලබාදුන් වහල් තරුණියක් සිටියාය. පාවුල්තුමා හා සීලස්තුමා ඇය යේසුස් වහන්සේගේ නාමයෙන් සුව කරනු ලැබීය.
- ඉන් කිපිනු ස්වාමිවරු මොවුන්ට බොරු චෝදනා කර සිරිපිගෙයි දැමීය.

## ◈ සිරගත වූ පාවුල් සහ සීලස්

- සීලස් සහ පාවුල්තුමා දෙවියන්වහන්සේ හට යාච්ඤා හා ගීතිකා ගයමින් සිටි අතර, විශාල් පොළෝ කම්පාවක් වී සිරගෙයි බැඳුම් ලිහී සියල්ලන්ට එළියට යාමට හැකි විය. ඉන් බිය වූ සිරගෙයි සෙබලා තම දිවි තොර කරගැනීමට සැරසුනි. එය දුටු පාවුල්තුමා විසින් එම අකටයුත්ත නවතා, ඔහුටද ගැළවීමේ සුභාරංචිය දේශනා කළේය. ඉන්පසු සෙබලාගේ ගෙටි වැසියෝද ඔහුද බෞතීස්ම වී යේසුස් වහන්සේ පිළිගත්හ.

- මෙලෙස පාවුල්තුමා හා සීලස්තුමා විසින් අභියෝගවලට පුහුණු දුනි.

## ◈ තෙසලෝනිකව හා බෙරියාව

- තෙසලොනිකයේදී මෙන්ම බෙරියාවේදී ධර්ම ශාලා දේශනා කළහ. ඒ නිසා ග්‍රීක ස්ත්‍රී පුරුෂ යම් පිරිසක් ඇදහිල්ලට පැමිණියහ. එම ඇදහිලිවන්තයන් හා ධර්මදූතකයින් හට යුදෙව් පීඩන එල්ල විය. මෙහි ප්‍රතිඵලය වූයේ සුබ අස්න ප්‍රකාශ කිරීමට තව නගරයකට යාමට පාවුල්තුමාට අවස්ථාව ලැබීමයි.

- සීලස් හා තිමෝතියස් පීඩන ඇති වූ නුවරවල නොපසුබට වීර්යෙන් නැවති සිටීම වැදගත්ය.

## ◈ ඇතැන්ස්

- දර්ශනවාදය, අධ්‍යාපනය, සාහිත්‍ය, විද්‍යාව, කලාවට ප්‍රසිද්ධ වූ නගරයක් ලෙස ඇතැන්ස් නුවර ගත හැකිය. එය ඊළඟට ධර්මදූත ගමනෙහි යෙදී නගරයයි.

- පාවුල් තුමා අන් අය තුළ කුතුහලය ඇති කරමින් සිය දහම ප්‍රචාරය කිරීමට අවස්ථාව ලබා ගත්තේය.

- අන් අයගේ මතවලට ඉඩ හැරියේය.

- යුදෙව්වන්, භක්තිවන්තයින් දිනපතා වෙළෙඳපොලෙහි සිටි අය සමඟ වාද කිරීම.

## ◈ නාඳුනන දෙවිඳුන්ට යන පූජාසනය

- ග්‍රීකයන් බොහෝ දෙවිවරු වන්දනා මාන කළ අතර, එම දෙවිවරුන් සඳහා පූජාසනය ඉදිකර තිබුණි. එහි ගිය පාවුල්තුමා හට දෙවිරුවක් නොමැති පූජාසනයක් දැක එකවර හෙයකින් හිස්ව තිබෙනවාදැයි ග්‍රීකයින්ගෙන් ඇසූ අතර, එය අප නොදන්නා දෙවි කෙනෙක්ගෙයි පැවසූහ.

- ඉන්පසු එම නාඳුන්න දෙවිඳුන්ට පූජාසනයක් ජනතාවට දෙවියන්වහන්සේගේ සුභාරංචිය තම ස්ථානෝචිත ප්‍රඥාවෙන් දේශනා කළ සේක.

## ◈ ඇතැන්ස්හි දේශකයෙහි අන්තර්ගතය...

- රූප නමස්කාරය පුහු බව දැක්වීම.
- ඇතැන්ස්හි වැසියන් භාවිතා කරන සාහිත්‍ය තුළින් තම දේශනය පෝෂණය කිරීම.
- දෙවියන්වහන්සේගේ අසමසම දේවත්වය හා සර්ව බලධාරීත්වය ගැන ප්‍රකාශ කිරීම.
- යේසුස් වහන්සේගේ පුනර්ජීවනය පිළිබඳ ඉදිරිපත් කිරීම.
- තම ස්ථානෝචිත ප්‍රඥාව හේතුවෙන් ඇතැන්ස්හි වැසියන් දෙවියන්වහන්සේ අදහා ගැනීම.
  උදාහරණ : දියෝනිසියස් /දමරිස්

## ◈ කොරින්ති...

- ග්‍රීසියේ දේශපාලන හා වානිජමය මධ්‍යස්ථානයක් වූ කොරින්ති දුරාචාරික නගරයකි.
- එහිදී පාවුල්තුමාට අකිලා ප්‍රිස්කිලා හමුවිය. එහි දී ා්වුල්තුමා සේම ඔවුන් දෙදෙනාද ප්‍රධාන වෘත්තිය ලෙස කූඩාරම් ගැසීම සිදු කළේය.
- සපත් දිනවල ධර්මශාලාවෙහි වාද කරමින් යුදෙව්වරුන් හා ග්‍රිකවරුන් ඇදහිල්ලය පමුණුවාලීමට ක්‍රියා කළේය.
- යුදෙව්වරුන්ගේ සුභාරංචිය ප්‍රතික්ෂේප වූයේද, විජාතීන් අතරට ගොස් ධර්මය දේශනා කළේය.

## ◈ කොන්ත්‍රෙයාව...

- පාවුල් අකිලාද ප්‍රිස්කිලාද සමඟ සිරියාවට යන අතරතුරදී භාරයක් වී සිටි බවත් තෙන්ක්‍රෙයාවට ගොස් එහි දී හිස මුඩු කර ගත්තේය.

- ඉන්පසු එපීසයෙන් නැව් නැග කායිසාරියට ගොඩ බැස පේරුසලමට ගොස් සිරියාවේ අන්තියෝකිය බලා පිටත්වුණි.

# 11 වන ශ්‍රේණිය - 15 වන පාඩම
## අභියෝග මැද මෙහෙවර

- **පාවුල්තුමා තෙවන, ධර්මදූත ගමන ආරම්භ වූයේ එපීස නගරය මුල් කරගෙනය. තිමෝතියස්, ත්‍රොපිමස්, පාවුල්තුමා, ලූක්තුමා මේ සඳහා නායකත්වය ගත්හ.**
- **එපීසය...**

ප්‍රසිද්ධ වෙළෙඳ නගරයක් වූ එපීසය මුළු ආසියාවේ අගනගරයයි. පාවුලුතුමා වාර 02 ක් එහි සිටි අතර, එහිදී විවිධ අභියෝගවලට සාර්ථකව මුහුණ දුනි.

### එපීසයේ සිදුවීම්

- ව්‍යක්ත කථිකයෙක් වූ අපෝලොස් ස්නාවක යොහාන්තුමාගේ බෞතීස්මය ගැන පමණක් දැන සිටි කෙනෙක් වූ අතර, අකිලා ප්‍රිස්කිලා ඔහුට දෙවියන් වහන්සේගේ මාර්ගය පිළිබඳ අදහාගැනීමට සැලැස්වූවේය.
- පාවුල්තුමා ස්නාවක යොහාන්ගේ ගොලයන් හමු වූ අතර, ඔවුන්ට යේසුස් වහන්සේ පිළිබඳ පැවසුවේය. ඉන්පසු ඔවුන් බෞතීස්මය ලැබූ අතර, ශුද්ධාත්මයෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කථා කිරීම.
- යකැදුරු ස්කාවාගේ පුත්‍රයන් සත් දෙනෙකු පාවුළුතුමාගේ හාස්කම් දැක පාවුල් දේශනාකර යේසුස් වහන්සේගේ නාමයෙන් හාස්කම් කිරීමට උත්සාහ කළ අතර, එය වැරදි ලෙස භාවිතා කිරීම නිසා තමන්ම විනාශය ඇතිකර ගති. එහි ප්‍රතිඵල ලෙස,
    - දේව බලය ප්‍රකාශ වීම.
    - නපුර හා අසත්‍ය විනාශ වීම.
    - යේසුස් වහන්සේගේ නාමයට ගෞරවය ඇතිවීම.
    - බොහෝ යකැදුරන් දෙවියන්වහන්සේ අදහා ගැනීම
    - දේව වචනය වැඩි වර්ධනය වීම.
- අර්තේමිස් දේවාලයේ රිදී රූප ව්‍යාපාරයට පහර වැදීම හා දෙමෙත්‍රියස් නම් රිදී රූප සාදන්නා පාවුල්තුමා ඇතුළු කණ්ඩායමට විරුද්ධව නටයුතු කිරීම. එහිදී ඇත්වලින් සෑදූ පිළිම, රූප නම්කාරය අර්ථ විරහිත බව පෙන්වා දුනි. එහි ප්‍රතිඵල ලෙස,
    - මිනිසුන් රූප වන්දනාවෙන් වැලකීම හේතුවෙන් රිදී රූප ව්‍යාපාරයට පහර වැදීම.
    - එකම සැබෑ දෙවියන්වහන්සේගේ නමස්කාරයේ වැදගත්කම අවබෝධ කරගැනීම.

### එපීසිය අවට නගරවල ධර්මදූත සේවය

- එපීසයෙහි ගමනෙන් පසු ග්‍රීසියට පැමිණ යුදෙව් පීඩා මැද සේවය කරමින් ගමනෙහි යෙදුණි.
- ත්‍රෝවසයේදී යුතිකස්ට ප්‍රාතිහාර්යාත්මක ලෙස නැවත පණදීම පැමිණි අභියෝගයක් විය.
- එපීසයේ සිටි සභා මූලිකයන් මිලේතසයට කැඳවා සිය සේවය පිළිබඳ තොරතුරු ඔවුන් සමඟ බෙදා ගත්හ. ඔවුන්ට නව ඇදහිලිවතුන්ගේ වගකීම පවරා ඔවුන්ගෙන් සමුගැනීම අභියෝගයට මුහුණ දුනි.
- අගබස් ප්‍රකාශ කළ තමාට විය හැකි පීඩාව දැන දැන, අධෛර්යයට පත් නොවී යෙරුසලමට යාමේ අභියෝගයට මුහුණ දුනි.
- මෙලෙස විවිධ වූ අභියෝග මධ්‍යයේ පාවුල්තුමා විසින් ශුද්ධාත්මයෙන් පූර්ණව තම ධර්මදූතය නොපිරිහෙලා ඉටු කළේය.

# 11 වන ශ්‍රේණිය - 16 වන පාඩම
# සාක්ෂියේ දිරියෙන් මෙහෙවර

- තෙවන ධර්මදූත ගමනෙහි අවසානයේද අනනියස් නම් දිවැසිවරයා පැවසූ ලෙසම ජෙරුසෙලම් දේවමාලිගාවේ දී පාවුල්තුමා අත්අඩංගුවට පත් විය.
- තම හැරීම සිදුවන අවස්ථාවේ දුටු දර්ශනය ලෙසට තමන් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය උදෙසා කොපමණ දුක්විඳින්නට ඕනෑදැයි පාවුල් තුමා ජෙරුසෙලමේදී සාක්ෂි දැරිය.
- රෝම පුරුවසියෙකු වශයෙන් තමාට හිමි වරප්‍රසාද යටතේ රෝම අධිරාජ්‍යයේ විනිශ්චය ලබාගැනීම සඳහා ඔහු අයැද සිටියේ කෙසේ හෝ රෝමයට ගොස් තම මෙහෙවර ඉටු කිරීමටයි.
- පාවුල්තුමා සිරකරුවෙකු ලෙස රෝමය බලා ගමන් කරයි. ඔහු සමඟ ලූක් හා ....... ද ගමනට එක්විය.
- රෝමයට යාමේදී අගොස්තීනු නම් බල ඇණියේ ජූලියන් නම් ශතාධිපතියාට පාවුල්තුමා භාර වූ අතර, එම නිසා යම්තාක් දුරකට නිදහස බුක්ති විඳිමට ඔහුට අවස්ථාව ලැබුණි.
- මාලිමාවක් නොතිබූ පැරණි කාලයේ නැව් ගමන් සඳහා මඟ දැක්වූයේ තාරකායි. බිහිසුණු කාලගුණ තත්ත්ව වලදී නැව් ගමනාගමනය වඩාත් අනතුරු දායක විය. පාවුල්තුමා රෝමයට යන අතර මඟදී මෙලෙස කුණාටු වලට භාජනය විය. ඒ කුණාටු පිළිබඳ පාවුල්තුමා විසින් කලින් දැන්වූවද ඒවා නොතැකුවේය.
- මෙලෙස පැමිණි බාධකයන් ලෙස පෙරකුලෝන් නම් කුණාටුව ගත හැකිය.
- මෙම කුණාටුව හේතුවෙන් සිරකරුවන් හා අනෙක් අය තවම ජීවිත පිළිබඳ ආශාව නැති කර අධෛර්යයට පත් විය. එම කළකිරීම නැති කිරීමට පාවුල් තුමා සාර්ථක වූ අතර, ඔහු දෙවියන්වහන්සේ පිළිබඳව සාක්ෂිදැරූ අතර, මේ හේතුවෙන් සියල්ල දිරිමත් විය.
- සාක්ෂිදැරීම තුළ ජීවිත කුණාටු හා අභියෝග ජයගැනීමට සවිය හා දිරිය ලැබේ.

## මෝලිටාවේදී සාක්ෂි දැරීම

- මෝල්ටාව, සිලිසියාවට සැතපුම් 60 ක් පමණ දකුණින් පිහිටි නගරයකි.
- එහි පාවුල්තුමා අතෙහි උග්‍ර විෂ සහිත සර්පයෙක් වෙළුණු අතර, ඔහුට කිසිදු හිරිහැරයක් එයින් නොවීය. එම අවස්ථාවේදී මිනිසුන් මොහු දෙවි කෙනෙක් යැයි සිතූහ.
- මෝල්ටාවේ ප්‍රධාන පබලියස්ගේ පියා උණෙන් හා අතීසාරයෙන් පෙළුනු විට එය සුවය දුන් පාවුල්තුමා දෙවියන්වහන්සේ සුවය පිළිබඳව එහිදී සාක්ෂි දැරිය.
- යාච්ඤාව විශ්වාසය භාස්කම් මගින් දෙවියන්වහන්සේ පිළිබඳ මනා පැහැදීමක් දූත ගමන් වලදී මිනිසුන්ට ලබාදුනි.

## රෝමයේදී සාක්ෂි දැරීම

- මෙහිදී යුදෙව් ප්‍රධානීන් අතරට ගොස් තම ජීවිත සාක්ෂිය පාවුල්තුමා දැරිය. මෙහිදී පැහැදිලි වන්නේ පාවුල්තුමා යේසුස් වහන්සේ පිළිබඳ සාක්ෂි දැරීම තම ඒකායන අභිප්‍රාය කරගත් බවයි.
- ජීවිත ගමන තුළ කිතුණුවන් කොරතම් බාධක, අර්බුද, ගාටලු වලට මුහුණපායි ද? නමුත් ඒ සියල්ල මධ්‍යයේ යේසුස් වහන්සේ විශ්වාසයවිතව සිටිමින් ඒවාය ජය ලබාගැනීම ශුද්ධාත්මයාණන්ගේ මඟ පෙන්වීම කෙසේ ලැබෙනවාද යන්න පාවුල්තුමාගේ මෙහෙවර තුළින් පැහැදිලි වෙයි.

# 11 වන ශ්‍රේණිය - 17 වන පාඩම
# ක්‍රිස්තුස්වහන්සේට අයත් මම

## ◈ යේසුස් වහන්සේ සහ නිකදෙමුස්

- යේසුස් වහන්සේ සිනගෝගවල මෙන්ම නොයෙකුත් ස්ථානවල ඉගැන්වූ නිසා රබ්බි (ගුරුදේවයාණන්) නම් විය.
- යේසුස් වහන්සේගේ සමහර ඉගැන්වීම්වලට පරිසිවරු එරෙහි වූ අතර, යුදෙව්වරුන්ගේ ප්‍රධානියෙකු වූ නිකදේමුස් පරිසිවරයෙකු හා ගුරුවරුයෙකු ද විය. ඔහු යේසුස් වහන්සේ පිළිබඳ පැහැදී හමුවීම තුළ පෙනී යන්නේ නිකදෙමුස් තම ආත්මික ගැළවීම පිළිබඳ සත්‍ය දැනගැනීම බොහෝ උත්සුක වූ බවයි.

- උසස් සමාජ තත්ත්වයක සිටි පුද්ගලයෙකු නිකදෙමුස් යේසුස් දෙවිඳුන් වෙතින් ආ කෙනෙක් ලෙස විශ්වාස කළ බවයි. එමෙන්ම යේසුස් වහන්සේ සමඟ සම්බන්ධ වීමට කැමැති බවයි.

- යේසුස් වහන්සේ නිකදෙමුස්ට දැක් වූ ප්‍රතිචාරය බයිබල් පාඨයකින් මෙසේය.

> ''ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. යමෙක් නැවත නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැක.'' (යොහාන් 3:3)

- යේසුස් වහන්සේ මෙලෙස පැවසුවද, නිකදෙමුස් මෙය වටහා නොගත් අතර, ''මිනිසෙකු මහළුව සිටියද නැවත මව් කුසට පිවිසිය හැකිද'' යන ප්‍රශ්නය යේසුස් වහන්සේගේ නිකදෙමුස් විචාරේය.

- ඒ අනුව එම වචනය පිළිබඳ යේසුස් වහන්සේ මෙලෙස නිකදෙමුස්ට තේරුම් කර දෙන ලදි.

- **යමෙකු නැවත නූපන්නොත්** - මෙම ගැඹුරු ආත්මික සත්‍යතාව යේසුස් වහන්සේ සරල ලෙස පහදා දුනි. එහි අදහස ලෝකයේ දෙවැනි වරට ඉපැදීමක් නොවන අතර, ආත්මික පිරිසිදු වීම මෙහි අර්ථයයි. පාපයෙන් පිරිසිදු වී යේසුස් වහන්සේ ප්‍රකාශ කළ ලෙස අලුත් ජීවිතයකට ඇතුළුවීම තම ආත්මික නැවත ඉපදීමයි.

- **දෙවිඳුන්ගේ රාජ්‍යය දැකීමට නොහැකිය** -පාපයට වහල් වූ තැනැත්තා දේව සම්බන්ධයෙන් ඈත් වේ. එවිට මිනිසාට අත්වන්නේ විනාශයේ ජීවිත අභ්‍යන්තර වෙනස හා යේසුස් වහන්සේට ප්‍රේම කිරීම හා සම්බන්ධවීම තුලින් දේව රාජ්‍යයේ උරුමය ලබා ගනී.

- යේසුස් වහන්සේ නිකදෙමුස්ට පැවසූ නැවත ඉපදීම නම් මෙයයි. යේසුස් වහන්සේ මෙහි දී ප්‍රකාශ කරන්නේ ආත්මයාණන්ගේ උපකාරීත්වය ඇතිව ජීවිත හැරීම් තුළින් අප අලුත් ජීවිතයක් හෙවත් අලුත් ඉපැදීමක් ලැබිය යුතු බවයි.

## ◈ යේසුස් වහන්සේ සහ සමාරිය ස්ත්‍රිය....

- යොහාන් සුභආරංචියට අවුය යේසුස් වහන්සේ සමඟ සංවාදයට ඇතුලු වූ තවත් වැදගත් චරිතයක් නම් සමාරිය ස්ත්‍රිය.
- සාමාන්‍යයෙන් යුදෙව්වන් හා සමාරියන් අතර කිසි ලෙසකින්වත් කිසිවක් සිදු නොවුනි.
- නමුත් යේසුස් වහන්සේ යුදෙව්වකු ලෙස සමාරිය ස්ත්‍රියගෙන් වතුර ඉල්ලීම ඇය මවිතියට පත් කරන්නකි.
- යේසුස් වහන්සේ මෙහිදී ක්‍රියා කළේ දෙවියන් වහන්සේගේ ප්‍රේමය යුදෙව්වන්ට පමණක් ලබාදෙන ප්‍රේමයක් නොවන බව පෙන්වීමටයි.
- ඒවගේම කාන්තාවන් දුරස්කර තබන ස්වභාවයක ඇයට කරුණා කර මනුෂ්‍යයන්ගේ වැදි දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කරන බව පෙන්වීමයි.
- යේසුස් වහන්සේගේ ප්‍රේමය වර්ගවාදය අභිබවා ක්‍රියාවන ප්‍රේමයක් බව මින් අපට පැහැදිලිය.
- යේසුස් වහන්සේගේ තුළ පවතින ආකල්ප වෙනසක් විය යුතුය. නිකදෙමුස් සහ සමාරිය ස්ත්‍රිය සමඟ යේසුස් වහන්සේ පැවැත්වූ සංවාද තුළින් එය වඩාත් පැහැදිලිය.

# 11 වන ශ්‍රේණිය - 18 වන පාඩම
# ක්‍රිස්තුස්වහන්සේට අයත් අප

- සමාජයක් යනු මිනිස් වර්ගයාගෙන් සැදුම් ලද්දකි. සෑම කෙනෙකුම අනිවාර්යෙන් අයත් වන ප්‍රාථමික සමාජ ඒකකය වන්නේ පවුලයි.
- පවුලේ නිර්මාතෘ දෙවිපියාණන් වහන්සේය.
- මැවිල්ලේ උසස් නිර්මාණය වන ආදම් සහ ඒව මවා දෙවියහන්සේ පටන්ගැන්ම ආරම්භ කළ සේක.
- එමෙන්ම මිනිසා සාමූහික ජීවිත ගත කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත විය.
- ආදම් සහ ඒව අතින් මිනිස් වර්ගයාගේ වර්ධනය වීම සිදුවන අතර ඒ තුළින් සමාජය බිහිවුණි.
- මුළු ලොවම සමාජය ලෙස සලකද්දී පවුල නැමැති කුඩාම ඒකකය ලෙව තුළ නිම වූ කුඩාම සමාජ සංස්ථාවයි.

## කිතුණු පවුලේ යුතුකම් හා වගකීම්....

### ◈ භාර්යාව හා ස්වාමි පුරුෂ වගකීම්

- ක්‍රිස්තුස්ට ඇති ගෞරවය නිස එකිනෙකාට යටත් විය යුතුය.
- භාර්යාව, සමිඳාණන් වහනසේට මෙන් ස්වාමියාට යටත්ව සිටිය යුතුය.
- පුරුෂයා යේසුස් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් දිවිපුදා කලාක් මෙන් භාර්යාවට ද ප්‍රේම කළ යුතුය.
- පුරුෂයා විසින් තම භාර්යාවට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතුය.

### ◈ දරුවන්ගේ වගකීම

- දෙවියන්වහන්සේ විසින් පවුලට දෙන තිළිණය වන්නේ දරුවන්ය. එබැවින් දරුවන් හදාවඩා ගැනීම්දී ඔවුන්ට ආදරය කරමින් අවශ්‍යතා සපුරාලීමට මෙන්ම විනයක් ඇතුව හැඩ ගැස්වීම දෙමව්පියන්ගේ වගකීමකි.
- එමෙන්ම තම දෙමව්පියන්ට සමිඳාණන් තුළ කීකරුවීම දරුවාගේ යුතුකමකි.
- දරුවා පියාටත් මවටත් ගෞරව කළ යුතු බව දස පනත සාක්ෂි දරයි.

### ◈ කිතුනුවකු තුළ තිබිය යුතු ජීවිත ප්‍රතිපත්ති

- කිතුනුවන් ලෙස සමාජ ජීවිතයේදී අපගේ ක්‍රියාවන් ස්වාමීන්ට ප්‍රසන්න විය යුතුය.
- අපගේ වචන ශක්තිමක් කිරීමට මිස එකිනෙකාගේ ජීවිත බිඳ දැමීමට හේතු නොවිය යුතුය.
- සමිඳුන් අපට කමා කළ පරිද්දෙන් අප සතුරන්ටද, මිතුරන්ටද කමාව දිය යුතුය.
- තවද, අප මුහුණ දෙන ගැටලු සඳහා ප්‍රේමයෙන් මුහුණ දී කටයුතු කළ යුතුය.
- කරුණාව පෙරදැරිව ජීවත් විය යුතුය.
- කිසිවෙකු ගැන අගුණ නොකීම හා කලහකාරී නොවිය යුතුය.
- දුප්පත් පොහොසත් බව හෝ සමාජ පවතින අනෙකුත් වෙනස්කම් නොසලකා සැමදෙනා සමඟ එකට කටයුතු කළ යුතුය.

## 11 වන ශ්‍රේණිය - 19 වන පාඩම
## සහජීවනයෙන් ගොඩ නැගෙමු...

- දෙවියන්වහන්සේ කිතුනුවන් ලෙස අපව කැඳවා ඇත්තේ දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා ක්‍රියා කිරීමටයි.
- ඒ සඳහා දෙවියන්වහන්සේ අපට පෙන්වා දී ඇත්තේ යේසුස් වහන්සේ ගමන් කළ දුෂ්කර මාර්ගය මෙන් අපගේ ජීවිත මාර්ගය දුෂ්කර විය හැකි බවයි.
- අප එකිනෙකාට විවිධ දීමනා ලැබී ඇත.
- මෙම දීමනා සභාව තුල විවිධ සේවා ලෙස අපට හඳුනා ගැනීමට හැකිය.
- එම දීමනා අපට ලැබී ඇත්තේ ක්‍රිස්තු ධර්මයට බද්ධව දේව අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා බව පැහැදිලිය. ඒ තුලින් අප ක්‍රිස්තු ශරීරය වර්ධනය කරමු.
- අප ජීවත්වන සමාජය මිශ්‍රඞ සමාජයන් වන අතර කිතුනු අනන්‍යතාවය රැකෙන අප සෑම ක්‍රියාත්මක කළ යුතුය.
- අප සමාජය තුල විවිධ අවස්ථාවන්වලදී ගැටෙයි.
    - සංස්කෘතික අවස්ථාවලදී
    - උත්සව අවස්ථාවලදී අප මෙවැනි අවස්ථාව වලදී අප කිතුනු අනන්‍යතාවය රැකගත යුතුය.
- පාවුල් තුමා පවසන ලෙස
    - අපි ජීවමාන දෙවියන්වහන්සේගේ මන්දිරය (2 කොරින්ති 6:16)
    - සිත කය කෙලෙසන සියලු දෙයින් වැලකී සිටිය යුතුය. (2 කොරින්ති 7:1)
    - දේව ගරු බිය ඇතිව ශුද්ධ කමින් පරිපූර්ණ විය යුතුය. (2 කොරින්ති 7:1)
- පාවුල්තුමාගේ මෙම කාරණා සලකා බැලීමේදී අප ලබන අධ්‍යාත්මික දැනුම ක්‍රියාකාරීත්වයට පත්කල විට සමහර අවස්ථාවලදී අපගේ අදහස් සමාජය තුල නොගැලපීම් විය හැකිය.
- මේ අවස්ථාවලදී අපගේ ඇදහිල්ල ආරක්ෂාකර ගැනීම අපේ වගකීමකි.
- එමෙන්ම දේව රාජ්‍යයේ ගුණාංග වටිනාකම්, අපගේ ජීවිතවලින් සමාජය තුල ඉස්මතු කිරීමද අපට ඇති වගකීමකි.
- උදාහරණයක් ලෙස තෙරේසා මව්තුමියගේ මෙහෙය ඇගහියහැකි, දේව රාජ්‍යයේ උතුම් ගුණාංගයක් වන දේව ප්‍රේමය සියලු ආගමික හා වාර්ගික සීමාවන් අභිබවමින් සමාජය තුල ගොඩනැගීමට ඇය සමත් විය.
- එලෙස අපද අනෙක් ජාතීන් අගම් සමඟ ප්‍රේමයෙන් ජීවතිවිය යුතු අතර තම කිතුණු අනන්‍යතාව රැකගැනීම සෑම වේලාවේදීම උත්සාහ කල යුතුය.

# 11 වන ශ්‍රේණිය - 20 වන පාඩම
# ආත්මයාණන්ගෙන් දිවි මඟ ලබමු

- බීමත්කම සහ මත්ද්‍රව්‍ය භාවිතය යනු අද සමාජයෙහි ඇති බලවත් ඛේදවාචකයකි.

- එමෙන්ම එම බීමත්කම ජීවිතය විනාශ කිරීමට මුල පුරන අතර, මත්පැන් සමඟ ගනුදෙනු කරන්නේ කවුරුන්ද ඔහුට දුක, කාලකණ්නි බව, මානසික විකෘතිතාවය, ශාරීරික දුබලතාවයන් සඳහා ගොදුරු වනු ලබයි.

- නරක මිත්‍ර ආශ්‍රය මගින් මෙම දේවල් සඳහා මිනිසා ගොදුරු වන අතර, කිතුනු අපට එය බලවත් අභියෝගයකි.

- තමාගේ මානසික වියවුල්තාවය හේතුවෙන් ඕනෑම දෙයක් කිරීමට පෙළඹෙන මිනිසුන් ඉතා දුක්ඛිත ජීවිත ගෙවමින් සිටියි.

- අපගේ ශරීර හිමිකාරීත්වය දෙවියන්වහන්සේ හටය. අප උන්වහන්සේ හට කැපව ඇත. නමුදු මෙම බීමත්කම හේතුවෙන් දේව ගෘහය අපම විනාශ කර දමයි.

- එම හේතුවෙන් අප මෙම අනවශ්‍ය දෙයින් ඉවත්ව කිතුනු අනන්‍යතාවය තම අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගත යුතුය.

- අප ආත්මයාණෝන් වහන්සේ තුළ හැසිරිය යුතුය. එවිට අප මාංශික නැතිනම් ශාරීරක ආශාවන්ට පෙළඹෙන්නේ නොමැත.

- එලෙස නොකරන්නා දේව රාජ්‍යයේ උරුමය නොලබනු ලබයි.

- සමාජයේ නපුරාගේ බලය උත්සන්න වෙමින් පවතින නිසා අපගේ ජීවිත දුක්ඛිත වී විනාශ මුඛයට යයි.

- අප ආත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම ඇතිව බුද්ධිමත්ව අප ක්‍රියාවෙන් දෙවියන්වහන්සේට ප්‍රසන්න ලෙස කළ යුතුය.

# 11 වන ශ්‍රේණිය - 21 වන පාඩම
# දරිද්‍රතාවයේ අභියෝග ජයගනිමු

- දරිද්‍රතාවය යනු දිළිඳු කමයි. එම දිළිඳුකම ආර්ථික වශයෙන් මෙන්ම ආත්මික වශයෙන්ද පැවතිය හැක.

## ලෞකික දිළිඳු බව

දිළිඳු බව පිටු දැකීමට නම්,

- දිළිඳුන්ට උපකාර කිරීම, ඔවුන් රැකබලා ගැනීම මෙන්ම පෝෂණය කිරීම ද සිදුකළ හැකිය. නමුත් ඊටත් වඩා ඔවුන්ට තම දිළිඳු භාවයෙන් මිදීමට තම ශක්තිය ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳව උලදෙස් ලබාදී ඒවාට යොමු කළ හැක.

- අලසව ක්‍රියා කිරීමෙන් දිළිඳු භාවය අත්දකිනු ඇත. අලස නොවී ක්සර වීමද ශ්‍රමය, ධය, නිසිලෙස ප්‍රයෝජනයට ගැනීමෙන්ද දිළිඳු භාවය අඩුකරගත හැක.

- පවත්නා සම්පත්, පුද්ගලයන් අතරේ කිසි ලෙස බෙදී යැමෙන්ද දිළිඳු බවෙන් මිදීමට හැකිය.

- අහිතකර හැසිරීම් රටාවලින් ඈත් වූ විය දිළිඳු බව නැති කරගත හැකිය.

- තම හැකියාවන් පිළිබඳ දැනුවත් වී ඒවා ධානත්මකව භාවිතා කිරීම තුළින් ලෞකික ජීවිතය තුළ සාර්ථකත්වයක් අත්කර ගත හැකිය.

- එමෙන්ම දිළිඳුකමේදී නොසැලී හඬා නොවැටී, අගහිගකම් කොතරම් තිබුණද. ප්‍රථමයෙන් ජීවත්වීමට උත්සාහ කළ යුතුය.

- ආත්මිකව තම ජීවිතය වර්ධනය කර ගත යුතුය. එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

## අධ්‍යාත්මික දිළිඳු බව

- ලෞකික වස්තුවට කැමති හා ඒවා පසුපස හඹායන මිනිසුන් මෙලොව බොහෝය.
- නමුත් මෙලොව ජීවිතය තාවකාලිකය.
- සදාකාලික ජීවිතයට අතුලු වීමට අවශ්‍ය ස්වර්ගික වස්තු අප රැස් කිරීමට උත්සහා කළ යුතුය.
- තණ්හාව වැඩිවීමෙන් දරිද්‍රතාව ඇතිවන අත මිනිස් සබඳතා හෙමෙන් ඈත් වෙයි.
- මෙයින් ආත්මික දිළිඳු බව වැඩි වෙයි.
- යේසුස් වහන්සේ විවිධ ඉගැන්වීම් මගින් නැති නොවන ධනවත් බව හා උරුමය ලබා ගැනීම මෙලොව ක්‍රියා කළ යුතු අන්දම පහදා දුනි.
  උදාහරණ :
    - ධනවත් ප්‍රධානියා පිළිබඳ දේශනය
    - ධනවතා සහ ලාසරුස් පිළිබඳ උපමාව

- මේවායින් අධ්‍යාත්මික දිළිඳු බවෙහි ඵලයන් ජනතාවට ඉගැන්වූයේය.

- දේව රාජ්‍ය තුළ සැබෑ පොහොසත්කම යනු, තමා තුළ ඇති ආත්මාර්ථය, අහංකාරය, උඩඟුව, වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව වැනි අයහපත් ගුණාංග වලින් හිස්වීමයි.

- එසේම තමන් සතුව ඇති ආර්ථික ධනවත්කම නිසා අහංකාර නොවී එය අවශ්‍යතාවයන් පෙළෙන තැනැත්තන් සමඟ බෙදාහදා ගැනීමෙන් ඇතිවන යහපත් ගුණාංග නිසා ස්වර්ගීය උරුමය හිමිකම් ලැබෙනු ඇත.

# 11 වන ශ්‍රේණිය - 22 වන පාඩම
# පීඩිත වූවන් මුදවාලීම

- මිනිසා විසින්ම ඇතිකරන ලද ව්‍යසන මෙන්ම ස්වභාවිකව ඇතිවන විපත්තිකාරී ව්‍යසනයන්ද හේතුවෙන් දෙවියන්වහන්සේ අපට දුන් ලෝකය බරපතල ලෙස දූෂණයට ලක්වී ඇත. මෙම හේතුවෙන් ඇතිවන පීඩා මිනිසාගේ වරදින් සිදුවන බව කිව හැක.

- නමුත් දෙවියන්වහන්සේගේ කැමැත්ත මෙම ලෝකය යහපත් ලෙසට පවත්වා ගැනීමයි.

- එනමුත් බල කණ්හාව, අත්මාර්ථය, තෘෂ්ණාව මුල් කරගත් පාපය මිනිස් සිත වෙනස් කර ඇති අතර අනෙකා මර්දනය කර ඉදිරියට යාම, හිංසා පීඩා කිරීමට පෙළඹීම වැනි අයහපත් දේ ලෝනයේ පෙනී යයි.

- මෙවැනිම වහල් බවට ගොදුරු වූ කණ්ඩායමක් ලෙස මිසරයේ සිටි ඉශ්‍රායෙල් ජනතාව ගත හැක. සංඛ්‍යාත්මක ලෙස ඉශ්‍රායෙල්වරු වැඩිවීම හා යම් දිනක මිසරය අයිතිකරගනී යන බිය හේතුවෙන් මිසරවරුන් ඉශ්‍රායෙල්වරුන්ට බර වැඩ දී ඔවුන් වහලුන් බවට පත්කළ අතර,

- මෙම පීඩා හේතුවෙන් වහලුන් දෙවියන්වහන්සේ හට මොරගැසීය. දෙවියන්වහන්සේ එවුන්ගේ පීඩාවන් දුටු සේක. ඔවුන්ගේ නිදහස් ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වූ සේක.

- එම හේතුවෙන් දෙවියන්වහන්සේගේ කරුණාව ලැබූ වහල් ජනයා මුදාගත් මොසෙස්තුමා ඉශ්‍රායෙල්වරුන් පොරොන්දු දේශයට ගෙන ගියේය.

- වර්තමාන සමාජය තුළ අසාධරණත්වය, ප්‍රචණ්ඩත්වය, හිංසනය හේතුවෙන් බොහෝ ජනයා හිංසාවට පත්ව ඇත.

- නිදහස, මාන අයිතීන්, සතුට ආදරය භුක්ති විඳිමට සෑම මිනිසෙකුට අයිතියක් තිබුණද, මෙම පීඩා හා හිංසන මිනිසාට එය අහිමි කර ඇත. දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේද මිනිස් අයිතිවාසිකම් සුරැකීමයි.

- එවැනි මිනිස් අයිතිවාසිකම් සුරැකි පුද්ගලයන් ලෙස මහත්මා ගාන්ධිතුමා, කළු සුදු වර්ණ භේදයට එරෙහිවූ මාටින් ලූතර් කිං, නෙල්සන් මැන්ඩෙලා, ඩෙස්මන් ටුටු, බිෂොප්තුමා වැනි අය අපට හඳුනාගත හැක.

## එදා යුදා සමාජය තුළ පවතින තත්ත්වය වෙනස් කරමින් යේසුස් වහන්සේ කටයුතු කළ ආකාරය

- සාකෙවුස්, පව්කාර ස්ත්‍රිය වැනි පව්කාරයක් ලෙස සමාජයෙන් කොන්වූ පිරිස් පිළිගැනීම.
- කාන්තාවන් දරුවන් අගය කිරීම.
- සමාරිය ස්ත්‍රිය වැනි විජාතීන් පිළිගෙන කටයුතු කිරීම.
- යක්ෂ ආත්ම දුරුකිරීම හා මළවුන් නැගිටුවීම.
- අංගභාග රෝගයා, මීමැස්මොර රෝගියා, ලාදුරු රෝගීන් වැනි කොන්වූ පිරිස් සුව කිරීම.
- නීතියට වඩා මනුෂ්‍යත්වය සලකා කටයුතු කළ සේක. (සබත් දින සුව කිරීම)

- වර්තමාන සමාජය තුළ මානසිකය, ශාරීරිකව, අධ්‍යාත්මිකව බොහෝදෙනා පීඩා විඳිති.

- යේසුස්වහන්සේ මෙලොව සේවයේදී පීඩාවට පත්වූ ජනතාවට සහනයක් වූ ලෙසටම කිතුනු අපද මෙලෙස ක්‍රියාකිරීම දෙවියන්වහන්සේගේ අපේක්ෂාවයි.

- එම හේතුවෙන් අප සැමටම ප්‍රේමයෙන් එකසේ සැලකීම දෙවියන්වහන්සේගේ අපේක්ෂාවයි.

# 11 වන ශ්‍රේණිය - 23 වන පාඩම

# සමාජ සාධාරණත්වය කරා

- 'ආමොස්' යන නමෙහි අර්ථය ''බර උසුලන්නා'' යන්නයි. (Amos) ක්‍රි. පූ. 08 වන සියවසේ මැද භාගයේ දකුණු යුදා රාජ්‍යයේ ජීවත් වූ අයෙකි. ඔහු යෙරුසලෙමට ආසන්න තෙකෝවා නම් නුවර උපත ලැබීය.
- එවකට ඉශ්‍රායෙලයේ II ජෙරබොවම් රජු සේවය කළේය. තමාගේ දිවැසිවැකි ආගත පරපුරට දැන ගැනීම සඳහා ඔහු ලිඛිතයට පත් කළ නිසා ඔහුගේ ජීවදත්ත පිළිබඳව මෙම පොතෙන් අවබෝධයක් ගත හැක.
- ඔහු එඬේරෙක් මෙන්ම ගොවියෙකි. (Amos 7:14)

## ආමොස්ගේ සමයේ සමාජ පසුබිම

- මෙම යුගයේ ආර්ථික වශයෙන් රට දියුණුවක පැවති නමුත්, අධ්‍යාත්මිකව ජනතාව පිරිහීමකට පැවැති අතර, බාහිර දියුණුව ද ව්‍යාජත්වය හා මුලාකාරී දියුණුවක් විය.
- අයුක්තියට අසාධාරණත්වය, වංචාව, සූරාකෑම, තාඩන පීඩන, ආගමික හා පරිපාලන අංශවල ප්‍රභූන් අතර බහුලව පැවැතිණි.
- රූප නමස්කාරය (පිළිම) ඉතා ඉහළින් පැවැති බව පෙනේ.
- මෙකල දකුණු රාජ්‍යයේ එතරම් ආර්ථික ප්‍රගතියක් නොතිබූ අතර, අමොස් තමා සතු බටළු ලොම් දහ අත්තික්කා විකුණා ගැනීමට උතුරු රාජ්‍යයක ගමන් කළේය.
- ආමොස් උතුරු රාජ්‍යයේ තත්ත්වය දේව දෘෂ්ටිකෝණයෙන් බලන්නට වරම් ලද අතර, ඔහු උතුරු රාජ්‍යයෙහි තත්ත්වය මැන බැලුවේ ප්‍රාග්ධනය මත නොව ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේගේ විනිශ්චය මතයි.

## ආමෝස්ගේ පණිවුඩයට සවන් දුන් ජනතාවගේ ස්වභාවය :

- සමාරිය, බෙතෙල්, ගිල්ගාල් යන ස්ථානවලට ගිය ආමෝස් ඉශ්‍රායෙල් වැසියන්ගේ සුඛෝපභෝගි ජිවන ශෛලය හා ධනය සමාජයේ පරිහැනියට තුඩු දුන් බව පෙන්වා දුන්නේය. මෙය දෙවියන්වහන්සේ නිග්‍රහ කිරීමකි.

- මාංශික තෘෂ්ණාවලට වහල්ව ජීවත් විය. මහත් අභිමතයෙන් යුතුව කුල දෙටුවෝ ඇත් දළ වලින් මස් කමින්, සීමා රහිතව මිදි යුෂ පාන කරමින් සංගීතයට සවන් දෙමින් කාලය ගෙවා දැමීය. ස්ත්‍රීන්ද මෙයට සහභාගී වූහ.

- ජාතියේ ශක්තිය කුඩා බිම් වලා කළ ගොවීන් වූ අතර, ඔවුන් ගැන තැකීමක් නොවීය.

- එකල පැවති යුද්ධය නිසා අස්වනු නොලබා මෙම දුප්පතුන් තම ඉඩම් විකිණීමට යොමු විය.

- අඩු මුදලට පොහොසතුන් මෙම ඉඩම් මිලට ගත්හ. ඉශ්‍රායෙලය මෝවබ් අල්ලා ගත් අතර, එයින් ගෙනෙන ලද බැටළු ලොම්, මිසරයේ රන් ආභරණ, දමස්කයේ සුවඳ විලවුන්, ආරබියේ කුළු බඩු, ඕපීර් හි රත්තරන්, ග්‍රීසියේ මල් බඳුන්, ෆිනීසියේ රිදී හා පටවස්ත්‍ර වලින් කඩපිල් පිරී පැවැතිණි.

- මෙම වෙළෙඳාම් වල නිරතව අලුතෙන් පොහොසත් වූ අය තම ධනය වර්ධනය කර ගැනීමට දුප්පතුන් සූරා කෑමට ලක් කළේය.

- ජීවත්වීමට නොහැකිව ණයට මුදල් ලබාගත් අයට ආපසු මුදල් ගෙවා ගැනීමට නොහැකි වූ විට ඔවුහු වහල්කමට පත් කර ගත් අතර, වහල් මිල ''සෙරෙප්පු දෙකක මිලකට'' සමාන විය.

- මෙකෙළ ආගමික සංස්ථාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු හෙයින් ආගමික වත් පිළිවෙත් ඉතා අලංකාර ලෙස සිදුවිය. විශාල ජන සමූහයන් ශුද්ධස්ථානවල දේව මෙහෙයන්ට සහභාගී විය.

- අන්‍ය ජාතිකයන්ට පෙනෙ පරිදි ඔවුහු ''ඉතා ආගමික ජාතියක්'' ලෙස කැපී පෙනෙන්නට විය. ඔවුහු සිතුවේ ලෞකික අභිවෘද්ධිය මෙම ශ්‍රද්ධාවේ ප්‍රතිඵලයක් බවය.

## ආමෝස්ගේ ප්‍රතිචාරය

- ආමෝස් මේ සියල්ල දෙස බැලුවේ දෙවියන්වහන්සේගේ දෘෂ්ටි කෝණයෙනි. ඔහු සමාජය මැන බැලූ මිනුම් දණ්ඩ එවකට සමාජ පසුබිමට හාත්පසින්ම විරුද්ධ විය.

- ආමෝස්ගේ ආගමික අවබෝධයෙන් පදනම දෙවියන්වහන්සේ හා ඉශ්‍රායෙල් අතර පැවතුනු කිට්ටු සබඳතාවයයි.

- ඔවුන්ගේ බලවත් දෙවියන්වහන්සේගේ ඉතිහාසය තුළ ක්‍රියාකාරී වූ සේක.

- මෙම යුගයේද පුදුම සහගත ලෙස දෙවියන්වහන්සේ ප්‍රකාශවන බවත්, සියලු ජාතීන් කෙරෙහි උන්වහන්සේ රජයන බවත්ය.

- දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලයට ඇලුම් වන නමුත් උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමට ඊටත් වැඩියෙන් ඇලුම්වන සේක.

- දෙවියන්වහන්සේ සිය ජනතාවගේ අයිතිවාසිකම් ලබාදෙන අකරම යුක්තිය ඉටු කිරීමට වැඩි උනන්දුවක් දක්වන සේක. එයට පිටුපෑම නිසා දෙවියන්වහන්සේගේ විනිශ්චය සිදුවන බව ආමෝස් තේරුම් ගත්තේය.

## ආමෝස්ගේ පණිවුඩය :

- ආමෝස් අවට ජාතින්ගේ වැරදි සහ දේව විනිශ්චය ඉදිරිපත් කරයි.
  - සිරියාවේ වැසියන්ගේ මිනිස් ඝාතන
  - තිර්හි වැසියන්ගේ මුළු ජාතියක් පිටුවහල් කොට එරදාමිට පාවාදීම.
  - අම්මොන්වරු කළ යුද්ධයකදී ගැබිනි මව්වරු දෙපළු කිරීම.
  - යුදා දේශය දේව පනත එපා කොට බොරු දේවලට ඇලුම් වීම.

- අන්‍ය ජාතීන්ගේ විනාශය ගැන ඉහ්‍රායෙල් සතුටු වූ නමුත් අවසානයේ ඔවුන්ට ද විනිශ්චය ප්‍රකාශය කළේය. ඔවුන්ට විරුද්ධ නඟන ලද චෝදනා ලැයිස්තුව අධික විය. එසේම ඔවුන් තෝරා ගත් සෙනඟ නිසා දඬුවම බරපතල බව ආමෝස් පෙන්වා දුන්නේය. (3:2) ඔහු දුටු දර්ශන මගින් ඒ බව පැහැදිලි වේ.

  **1 දර්ශනය**
  පළගැටියන් කන්දරාවත් දේශයේ පලා වර්ග සියල්ලක්ම කා දැමීම

  **2 දර්ශනය**
  පොළොව යට ජලය දවාලු ගින්න් ගොඩබිමද දවන්නට පටන් ගැනීම.

  **3 දර්ශනය**
  දෙවියන්වහන්සේ ලඹ ලණුවක් ගෙන සෙනඟ ඇද කුද කෙතරම්දැයි ආමෝස්ට වටහාදීම හා ''දඬුවම් දිමට ඇති අදහස වෙනස් නොකරන බව'' ප්‍රකාශ කිරීම.

- එහෙයින් ඉශ්‍රායෙල් අපේක්ෂා නොකරන අන්දමට දේව විනිශ්චය බවත් ඔවුන් අපේක්ෂා නොකරන ලෙස දීප්තියක් නැති තිත් කළුවර දවසන් උදාවන බවත් පැවසුවේය. (5:20)

- මීට පළමුව විරෝධය පලකළේ, බෙතෙල් හි පූජක තැන වන අමසියාය. ඔහු ආමොස් නයා අතර කුමන්ත්‍රණයක් දියත් කරන බව පැවසීය. අමසියා අමෝස් පලවා හරිමින් යුදාට ගොස් ජීවත්වන පැවසීය. නමුත් ආමෝස් තමා රැකියාවක් ලෙස නොව සේවයක් ලෙස කැඳවීම අනුව දිවැස්වැකි පවසන බවත් ඔහුටද දේව විනිශ්චය උරුම වන බවත් පැවැසීය. (7:14-17)

- පූජකවරු පවා දිවැස්වැකි සවන් නොදීමේ ප්‍රතිඵලය ලෙස ''අමෝස් දුටු 4 වන දර්ශනය තුළ පැසුණු පලතුරු ඇති කූඩයෙන්'' විනිශ්චය ඉතාම ළඟ බව දැන ගත්තේය.

# 11 වන ශ්‍රේණිය - 24 වන පාඩම

## පිවිතුරු දිවියක් කරා...

- ක්‍රි.පූ. 08 වන ශතවර්ෂය දකුණු යුදා රාජ්‍යයට අසිරියා අධිරාජ්‍යයාගෙන් බලවත් දේශපාලන තර්ජන එල්ල වී තිබුණි.

- ඉන්පසු සිරියාවෙන් හා ඉශ්‍රායෙල් හා ඉශ්‍රායෙල් රාජ්‍යයෙන්ද ආක්‍රමණ හා තර්ජන තිබුණි. යෙසායාගේ කැඳවීම මෙවැනි පසුබිමක දිවැසිවර කාර්යයක් ඉටුකිරීම් සඳහා විය.

- යෙසායා දෙවියන්වහන්සේ අපේක්ෂා කරන ''ශුද්ධත්වය'' පිළිබඳ බලගතු දිවැසිවැකි හෙළිදරව් කරයි.

- යෙසායා සිය කැඳවීම ලබන්නේ ශුද්ධ වූ දේව මාලිගාවේ සිටියදීය. ඔහු දුටු දර්ශනය තුළින් දෙවියන්වහන්සේ ශුද්ධ මාලිගාව තුළදී ඔහුගේ පාපය කමාකර දිවැසිවර සේවය සඳහා වූයේ ඔහු කැප කළ සේක.

- මෙසේ දෙවියන්වහන්සේ ඉදිරියේ පිළිගැනීමක් ලබන මිනසා කමාව ලබනවා පමණක් නොව ඊටත් පවා වැඩියමක් දෙවියන්වහන්සේ වෙතින් ලබයි.

- එය නම් සුවිශුද්ධ දෙවියන්වහන්සේ මිනිසා හට ලබාදෙන ශුද්ධකමේ ජීවිතයයි.

- යෙසායාට දෙවියන්වහන්සේ ලබාදුන් ශුද්ධත්වය දෙවියන්වහන්සේගේ දිවැසිවර සේවය ඉෂ්ඨ කිරීමට යෙසායට ලබාදෙන ලද්දකි. එනම් දේව හඬ මිනිසුන්ට ඉදිරිපත් කිරීමටයි. එය දුෂ්කරය, කටුකය.

- අපේ පාපී ස්වභාවය බරපතල නම් දෙවියන්වහන්සේගෙන්ක මාව ඉල්ලුවේ නම් දෙවියන්වහන්සේ අපහට පාප කමාව දෙනු ඇත.

  උදාහරණ : දාවිත් රජ බෙත්ෂෙබා හට ඇලුම් වී විශාල පාපයක් සිදු කළේය. ඔහුට දෙවියන්වහන්සේ කමා සමඟ නැති බවයි සිතුණේය. නමුත් දාවිත් හට ''නිර්මල සිතක්'' අවශ්‍ය විය. එම නිසා දාවිත්තුමා තම පාප ගැන පසුතැවී දෙවියන්වහන්සේගෙන් කමාව ඉල්ලුවේය.

- දෙවියන්වහන්සේ පිවිතුරු සිතක් ජීවිතයක් ලබන මිනිසා සෑම විටම සමාජයේ යහපත සඳහා ක්‍රියාකරයි. ඔහු/ඇය දෙවියන්වහන්සේ හට වුවමනා ආකාරයට ක්‍රියාකරන්නෙකු බවට පත්වේ.

- දෙවියන්වහන්සේ යෙසායාට පැවරූ ශුද්ධ වූ මෙහෙවර නම් උන්වහන්සේගේ දිවැසිවර කාර්යය භාරය ජනතාව අතරට ගෙන යාමයි. මෙය පහසු දෙයක් නොවීය. නමුත් දෙවියන්වහන්සේ ඔහු තුළ ශුද්ධතම සහතික කොට ඒ උදෙසා පාවිච්චි කළ සේක. යෙසායා හට ඔහුගේ හා සෙනගගේ පාප ගැන මනා අවබෝධයක් විය.

- අපටද යොසායාට මෙන් ශුද්ධත්වය උරුම කරදී තිබේ. ඒ අපම පාරට්ටු කර ගැනීමට නොවේ. දේව කාර්යය මිනිසුන් අතර බටු කිරීමටයි.

- අපගේ පාපි ස්වභාවය අපි අවබෝධ කර ගත යුතුය එවිට අපි දේව අයිතියට යටත් වනු ඇත.

- දාවිත්තුමා පව් කළ නමුත් තම වරද හා එහි බරපතලකම වටහා ගෙන පසුතැවිලි විය. දෙවියන්වහන්සේ ඔහුට කමා කළ සේක.

- දෙවියන්වහන්සේගේ පිවිතුරු සිත ඇති පුද්ගලයා නිතරම සමාජයේ යහපත උදෙසා ක්‍රියා කරයි. අපද එම සිත උරුම කර ගන්නා පිණිස ශුද්ධාත්ම අනුහසට යටත් වෙමු.

# 11 වන ශ්‍රේණිය - 25 වන පාඩම
# නවෝදයේ අරණලු...

- මීකා දිවැසිවරයා ද යොසායා මෙන්ම දර්ශනයක් තුළින් දිවැසිවර මෙහෙයට කැඳවන ලදි. මීකා ද යෙසායාතුමාගේ සමකාලීනයෙකි. එතුමා ජීවත් වූයේ සාමාන්‍ය ජනතාව අතරේය. දිවැසිවැකි ප්‍රකාශ කළේ, ''දකුණු දිග ජුදා රාජ්‍යයටය''
- එතුමා සමාජ සාධාරණත්වය වෙනුවෙන් දැඩි ලෙස කථා කරයි. එම නිසා රාජ්‍ය පාලකයින් ඔහුහෙලා දකියි. දේව අභක්තිය හා නරක ගති පැවතුම් නිසා යෙරුසලම නටබුන් වන බවට දිවැසි වැකි පවසයි.
- එතුමා ප්‍රකාශ කරන ඇතැම් උදාර අදහස් කිහිපයක් මෙසේය.

## 1) සමිදාණන් උදා කරන සාම යුගය

- (මීකා 4:1) අනුව ''මතු දවස'' යනු දෙවියන්වහන්සේ කිසියම් සුවිශේෂී කාලයක සාමය පිහිටුවන බවය. එය සිදු වන්නේ යෙරුසලමේය. වාද භේද, ක්‍රෝධ, අභිබවා සාමය රටතුළ ස්ථාපිත වනු ඇත.
- (මීකා 43) අනුව දේව සෙනඟ සාමකාමී ජීවිත රටාවන් ගෙවනු ඇත.

  ''තමන්ගේ කඩුවලින් නඟුල් නලද, හෙල්ල වලින් දෑ කැතිද සාදනු ඇත. යුධ මානසිකත්වය සම්පූර්ණයෙන්ම පහ වනු ඇත.''
- සාමය ඇති විට බිය පහවී යයි. සාමයේ ප්‍රතිඵලය සමෘද්ධියයි. මෙම සමෘද්ධිය උදාවන්නේ දෙවියන්වහන්සේ තුළිනි. ඒ සඳහා අන්ත මිදි වැලට බද්ධ වී ඇති සේ අපි දෙවියන්වහන්සේ හා එක්විය යුතුයි.
- පුරාණ ගිවිසුමේ මිදි වතු රූපකය බෙහෙවින් යොදා ගෙන තිබේ. එයින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා සැපයීම අවධාරණය කෙරේ.

## 2) සාමය "ශලොම් ලෙස"

- හේබ්‍රෙව් බසින් ''ෂාලොම්'' යනු සාමයයි. එම සාමය පිහිටුවනු ලබන්නේ යුක්තිය හා සාධාරණත්වය ඇති තැනකය.
- සාමය ඇති කිරීම සාමකාමී දිවිපෙවෙතක් ගත කිරීමට කිතුණුවාට ඉතා අවශ්‍ය දෙයකි. ඒ තුලින් දේව දරුකම අපට උරුම වේ.

## 3) සමගිවීමන් උදෙසා මැදිහත් වීමේ අභියෝගය

- අපේ රට තුළ ජාති, ආගම්, කුල, පක්‍ෂ භේද වහයෙන් බෙදී සිටිනු ඇත. එවන් සමාජයක සාමය ඇති කරන්නන් ලෙස කටයුතු කිරීමේ අභියෝගය අපට ඇත.
- නිවස, පාසල, බල්ලිය, සමාජය වැනි ඕනෑම අවස්ථාවක එය කළ යුතුව ඇත.
- ගරු මයිකල් ලැප්ස්ලි පියතුමා ඊට කදිම උදාහරණයකි. එතුමා ඉපදුනේ දකුණු අප්‍රිකාවේය. එතුමා සුදු-කළු වර්ණ භේදය දුර කිරීම කැපවීමෙන් කටයුතු කළේය.
- එහි දී එතුමාට තම දෑත්වලින් කොටසක් අහිමි විය. එසේම ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, සෝමසිරි කේ. පෙරේරා පියතුමා වැනි අයද සාමය උදෙසා මැදිහත් වූ අය වෙති.